



විද්‍යුත් පුරවැසි වාර්තාපතේ (eCRC) සොයා ගැනීම්

# ද්විතීය අධ්‍යාපන සේවා සම්පාදනය පිළිබඳ සමීක්ෂණය

## මඩකලපුව දිස්ත්‍රික්කයේ තෝරාගත් ග්‍රාම නිලධාරි වසම් පිළිබඳ වාර්තාව

2018 ජූනි

බාසිත් අයිනදීන්, ඉසුරු තෙන්නකෝන්, මේහලා මහිල්රාජා, කේ. රොමේෂන් සහ හසන්ති තෙන්නකෝන්



centre for poverty analysis

විද්‍යුත් පුරවැසි වාර්තාපතේ (eCRC) සොයා ගැනීම්

# ද්විතීය අධ්‍යාපන සේවා සම්පාදනය පිළිබඳ සමීක්ෂණය

## මඩකලපුව දිස්ත්‍රික්කයේ තෝරාගත් ග්‍රාම නිලධාරි වසම් පිළිබඳ වාර්තාව

---

## 2018 ජූනි

බාසිත් අයිනදීන්, ඉසුරු තෙන්නකෝන්, මෙහලා මහිල්රාජා,
කේ. රොමේෂන් සහ හසන්ති තෙන්නකෝන්

© දරිද්‍රතා විශ්ලේෂණ කේන්ද්‍රය 2018

පළමු වන මුද්‍රණය 2018

ISBN: 978-955-3628-11-4

ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය ප්‍රකාශනගත සුචිකරණ දත්ත

ද්විතීය අධ්‍යාපන සේවා සම්පාදනය පිළිබඳ විද්‍යුත් පුරවැසි වාර්තාපතේ (eCRC)
සමීක්ෂණයේ සොයා ගැනීම් : මඩකළපුව දිස්ත්‍රික්කයේ තෝරාගත්
ග්‍රාම නිලධාරී වසම් පිළිබඳ වාර්තාව / බාසිත් අයිනදීන්...(සහ තවත් අය) .
කොළඹ : දරිද්‍රතා විශලේෂණ කේන්ද්‍රය, 2018
පි. 38 ; සෙමී. 29

ISBN: 978-955-3628-11-4

i. 373.07205493 ඩීවී 23 ii. බාසිත් අයිනදීන් (සම කර්තෘ)

1. අධ්‍යාපනය, ද්විතීය ශ්‍රී ලංකාව පර්යේෂණ

මෙම ප්‍රකාශනයේ ප්‍රකාශන හිමිකම් දරිද්‍රතා විශ්ලේෂණ කේන්ද්‍රය සතුය. මෙම පොතේ යම් කොටසක් ප්‍රතිනිෂ්පාදනය කරන්නේ නම් පෙර කතුවරයාගෙන් සහ ප්‍රකාශකයාගෙන් නිසි අවසරය ලබා ගත යුතු වේ.

CEPA ආයතනයේ වර්තමාන ප්‍රකාශන මාලාව සමන්විත වන්නේ මෙම ලියවිලිවලිනි: අධ්‍යයන, සංස්කරණය කරන ලද වෙළුම්, කාර්ය පත්‍රිකා සහ තොරතුරු පත්‍රිකා. මෙම අධ්‍යයනයේ ඇතුළත් සොයා ගැනීම් හා නිර්දේශ ඉදිරිපත් කරන ලද්දේ අදාළ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල රාජ්‍ය සේවා සම්පාදකයන් හා සේවාලාභීන් විසිනි. මෙම අධ්‍යයනය CEPA ආයතනයේ හෝ ආධාර දෙන ආයතනයේ අදහස් හෝ ප්‍රතිපත්ති පිළිබිඹු නොකරයි.

මෙම ප්‍රකාශනය පිළිබඳ සියලු විමසීම් පහත සම්බන්ධතා වෙත යොමු කළ යුතුය:
දරිද්‍රතා විශ්ලේෂණ කේන්ද්‍රය
29, ආර්. ජී. සේනානායක මාවත, කොළඹ 07, ශ්‍රී ලංකාව.
දුර : +94 (011) 46902200, 2676955
විද්‍යුත් තැපෑල : info@cepa.lk
වෙබ් අඩවිය : www.cepa.lk

මෙම ප්‍රකාශනය සම්පාදනය කරන ලද්දේ යුරෝපා සංගමයේ සහාය ඇතිව ය. මෙම ප්‍රකාශනයේ අන්තර්ගතය සම්බන්ධ වගකීම සම්පූර්ණයෙන් ම CEPA ආයතනය විසින් දරනු ලබන අතර යුරෝපා සංගමයේ ස්ථාවරය පිළිබිඹු කරන්නක් ලෙස කිසි සේත් ම සැලකිය නොහැකි ය.

# කතුවරු

## බාසිත් අයිනදීන්

CEPA ආයතනයේ පර්යේෂණ වෘත්තිකයෙකි. ඔහු කොළඹ විශ්වවිද්‍යාලයෙන් සමාජ විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රවේදී උපාධිය ලබා ගත්තේ ය. බාසිත් බහුපාර්ශ්වීය ක්‍රියාවලි හා සමාජ ඉගෙනුම් සම්බන්ධයෙන් නෙදර්ලන්තයේ වාහනින්ගන් විශ්වවිද්‍යාලයේ ද සමාජ වග වීමේ මෙවලම්, විශේෂයෙන් ම පුරවැසි වාර්තා පත් ක්‍රමවේදය සම්බන්ධයෙන් ඉන්දියාවේ බැංගලෝරයේ මහජන කටයුතු මධ්‍යස්ථානයේ ද ජාත්‍යන්තර බලපත්‍රලාභියෙකි. ක්‍රියාකාරකම් හා ව්‍යවහාරික පර්යේෂණ පිළිබඳ සිය විශේෂඥතාව දායක කරමින් CEPA ආයතනයේ දී බාසිත් නිරතව සිටින්නේ හැකියා ගොඩ නැගීම, පුහුණුව සහ පර්යේෂණය යන ක්ෂේත්‍රවල ය. මේ වන විට ප්‍රජා මූල මට්ටමේ සිවිල් සමාජ සංවිධාන සමග කටයුතු කරමින් ප්‍රමුඛ කාර්ය භාරයක් ඉටු කරමින් සිටින ඔහු සමාජ වග වීමේ යන්ත්‍රණයන් පිළිබඳ හැකියා ගොඩ නැගීම සඳහා සහාය දෙයි. වවුනියාව හා මුලතිවු දිස්ත්‍රික්කවල ද්විතීය අධ්‍යාපන සේවාවන් සම්බන්ධයෙන් CEPA ආයතනය විසින් 2014 දී සිදු කරන ලද පුරවැසි වාර්තා පත් සමීක්ෂණය හා ඊට අදාළව නිකුත් කරන ලද ප්‍රකාශනය සඳහා ද ඔහු මූලිකත්වය ගෙන කටයුතු කර ඇත. මේ වන විට ඔහු CEPA ආයතනයේ පුරවැසි වාර්තා පත් යහපාලන මෙවලම සඳහා මූලිකත්වය ගෙන කටයුතු කරමින් සිටී.

## ඉසුරු තෙන්නකෝන්

CEPA ආයතනයේ කනිෂ්ඨ පර්යේෂණ වෘත්තිකයෙකු ලෙස කටයුතු කරයි. කොළඹ විශ්වවිද්‍යාලයෙන් ආර්ථික විද්‍යාව, ආර්ථික ප්‍රතිපත්තිය හා කළමනාකරණය පිළිබඳ ශාස්ත්‍රවේදී උපාධියක් ලබා ඇති ඔහු මේ වන විට කොළඹ විශ්වවිද්‍යාලයෙහි ආර්ථික සංවර්ධනය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලොමා පාඨමාලාවක් හදාරමින් සිටී. උපදේශන කායික විද්‍යාව පිළිබඳ ඩිප්ලෝමාධාරියෙකු ද වන ඔහු, උපදේශකයෙකු ලෙස කටයුතු කර ඇත. කවියෙකු වන ඉසුරු මේ වන විට කවි පොත් තුනක් පළ කර ඇත. කලින් ඔහු ව්‍යාපෘති සම්බන්ධීකාරකවරයෙකු හා පර්යේෂණ සහායකයෙකු ලෙස ලාභ නොලබන සංවිධාන සමග කටයුතු කර ඇත. CEPA ආයතනයේ දී ඉසුරු කටයුතු කරන්නේ තේමාත්මක පර්යේෂණ ක්ෂේත්‍රයක් වන දරිද්‍රතාවේ පැතිකඩවල් සම්බන්ධයෙන් සහ සන්නිවේදන කණ්ඩායම සමග ය. මේ වන විට ඔහු පුරවැසි වාර්තා පත පිළිබඳව අවධානය යොමු කරන අධ්‍යයනයක නිරතව සිටින අතර මොණරාගල දිස්ත්‍රික්කයේ ක්ෂේත්‍ර සම්බන්ධීකරණ කාර්යය භාරව කටයුතු කරයි.

## මේහලා මහිල්රාජා

CEPA ආයතනයේ පර්යේෂණ වෘත්තිකයෙකි. ඇය පේරාදෙණිය විශ්වවිද්‍යාලයෙන් සංවර්ධන භාවිතය පිළිබඳ ශාස්ත්‍රපති උපාධියක් ලබා ඇත. ඇය ශ්‍රී ලංකා ඇගයීම් සංගමයේ (SLEvA) ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනයෙහි (NILS) නිරීක්ෂණය හා ඇගයීම පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාවක් සම්පූර්ණ කර ඇත. CEPA ආයතනයේ දී මේහලා නිරතව සිටින්නේ හැකියා ගොඩ නැගීම, පුහුණුව සහ පර්යේෂණය යන ක්ෂේත්‍රවල ය. ඇය ක්‍රියාකාරකම් පර්යේෂණ සම්බන්ධයෙන් තමන් සතු විශේෂඥතාව පර්යේෂණ කටයුතුවලට එක් කරයි. මේ වන විට ප්‍රජා මූල මට්ටමේ සිවිල් සමාජ සංවිධාන සමග කටයුතු කරමින් ප්‍රමුඛ කාර්ය භාරයක් ඉටු කරමින් සිටින මේහලා සමාජ වග වීමේ යන්ත්‍රණයන්, විශේෂයෙන් ම 'පුරවැසි වාර්තා පත්' මෙවලම, පිළිබඳ හැකියා ගොඩ නැගීම සඳහා සහාය දෙයි. ඇය වවුනියාව හා මුලතිවු දිස්ත්‍රික්කවල ද්විතීය අධ්‍යාපන සේවාවන් සම්බන්ධයෙන් CEPA ආයතනය විසින් 2014 දී සිදු කරන ලද පුරවැසි වාර්තා පත් සමීක්ෂණය හා ඊට අදාළව නිකුත් කරන ලද ප්‍රකාශනය සඳහා ද දායක වී ඇත.

## කුලසබානාදන් රොමේෂන්

CEPA ආයතනයේ ජ්‍යෙෂ්ඨ පර්යේෂණ වෘත්තිකයෙක් ද කළමණාකරන කණ්ඩායමේ සාමාජිකයෙක් ද වේ. පසු ගිය විසි වසර තුළ ඔහු රජය හා අරමුදල් සපයන සංවිධාන සමග එක්ව සංවර්ධන ක්ෂේත්‍රයෙහි කටයුතු කර ඇත. ඔහු කොළඹ විශ්වවිද්‍යාලයෙන් මූල්‍ය ආර්ථික විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධියක් ලබා ඇත.

දරිද්‍රතාවේ පැතිකඩවල් වැඩසටහනේ කණ්ඩායම් නායකයෙකු වන රොමේෂ් සහ ඔහුගේ කණ්ඩායම CEPA ආයතනයේ පර්යේෂණ හා උපදේශන ක්‍රියාකාරකම් පදනම් කර ගෙන දරිද්‍රතාව, අසමානතාව හා සමෘද්ධිය පිළිබඳ පණිවුඩ සසඳා බැලීම සම්බන්ධයෙන් වගකීම දරති. දරිද්‍රතාවේ පැතිකඩවල් කණ්ඩායම දරිද්‍රතාමානය පිළිබඳ කටයුතුවල ද නිරතව සිටින අතර දරිද්‍රතාවට සාර්ව සාධක කරන බලපෑම විමසා බැලීම සඳහා ද මුල පුරමින් සිටියි.

## හසන්ති තෙන්නකෝන්

ටැස්මේනියා විශ්වවිද්‍යාලයෙන් පාරිසරික කළමනාකරණය පිළිබඳ ශාස්ත්‍රපති උපාධියක් ලබා ඇති අතර සමායතනික ස්ථාවර භාවය සම්බන්ධයෙන් පුළුල් අත්දැකීම් ලබා ඇත. ඇයගේ අවධානය යොමු වන්නේ පාරිසරික තිරසර භාවය හා සමාජීය තිරසර භාවය යන ක්ෂේත්‍ර කෙරෙහි ය. මේ වන විට ඇය CEPA ආයතනයේ පර්යේෂණ උපදේශකවරයෙකු ලෙස මෙන් ම ලෝක බැංකුවේ සමාජ ආරක්ෂණ උපදේශකවරයෙකු ලෙස ද කටයුතු කරයි.

## දරිද්‍රතා විශ්ලේෂණ කේන්ද්‍රය

දරිද්‍රතා විශ්ලේෂණ කේන්ද්‍රය (CEPA) යනු දරිද්‍රතාව ආශ්‍රිත සංවර්ධන ගැටලු පිළිබඳව දැනුම හා අවබෝධය පුළුල් කිරීමට කටයුතු කරන ස්වාධීන, ශ්‍රී ලාංකික බුද්ධිමතුන් කණ්ඩායමක එකතුවකි. දරිද්‍රතාව යනු වහා විසඳුම් සෙවිය යුතු සමාජ, ආර්ථික, දේශපාලන හා සංස්කෘතික අසාධාරණයන් සිදුවන්නක් බව අපගේ අවබෝධයයි. දරිද්‍රතාව සම්බන්ධ ගැටලු ආමන්ත්‍රණය කිරීමට නම් දේශීය හා ජාත්‍යන්තර වශයෙන් ප්‍රතිපත්ති හා භාවිතයන් වෙනස් විය යුතු බව හා දරිද්‍රතාවෙන් පෙළෙන ජනයා සමග එක්ව වැඩ කළ යුතු බව, CEPA ආයතනය විශ්වාස කරයි. ජාතික හා ප්‍රාදේශීය වැඩසටහන් හා ව්‍යාපෘතිවලදී දරිද්‍රතාව ආශ්‍රිත සංවර්ධන ප්‍රතිපත්තිවලට බලපෑම් කිරීම සඳහා දායක වීමට CEPA ආයතනය ප්‍රමුඛත්වය ලබා දේ. CEPA ආයතනය ලෙස අප අවධානය යොමු කරන්නේ ස්වාධීන විශ්ලේෂණ ඉදිරිපත් කිරීම, සංවර්ධන ක්‍රියාවලියට දායක වන්නන්ගේ හැකියාවන් වර්ධනය සහ ප්‍රතිපත්තිමය බලපෑම් කළ හැකි අවස්ථා සොයා බලා ඊට මැදිහත් වීම කෙරෙහිය. වඩා විශ්වසනීය අනුභූතික සාක්ෂි පදනම් කර ගෙන සමාජීය අවශ්‍යතාවයන් හඳුනාගෙන සේවාවන් සැපයීමට අප ආයතනය කටයුතු කරනු ලබයි. CEPA ආයතනය සේවාදායකයන්ගේ ඉල්ලීම් අනුව සුදුසු බුද්ධිමය හා තාක්ෂණික සේවාවන් ලබා දීම මෙන්ම පශ්චාත් ගැටුම් සංවර්ධනය, අවදානමට ලක් වීමට තිබෙන ඉඩකඩ, සංක්‍රමණය, යටිතල පහසුකම් හා පරිසරය වැනි පුළුල් තේමාත්මක ක්ෂේත්‍ර පහක් පදනම් කර ගෙන කාලීන වැදගත්කමකින් යුත් පර්යේෂණවල ද නිරත වේ.

# රූප සටහන් මාලාව


| | | |
|---|---|---|
| 1 රූප සටහන | : තමන්ගේ ග්‍රාම නිලධාරි වසම තුළ සහ පිටත පිහිටි පාසල්වලට යාම | 7 |
| 2 රූප සටහන | : තමන්ගේ ග්‍රාම නිලධාරි වසමෙන් පිටත පිහිටි පාසල්වලට යාමට හේතු | 7 |
| 3 රූප සටහන | : අධ්‍යාපනයේ ගුණාත්මක බව පිළිබඳ සමස්ත තෘප්තිය | 8 |
| 4 රූප සටහන | : එරාවූර් කොට්ඨාසය තුළ අධ්‍යාපනයේ ගුණාත්මක බව පිළිබඳ තෘප්තිය | 8 |
| 5 රූප සටහන | : කෝරලෙයිපත්තු කොට්ඨාසය තුළ අධ්‍යාපනයේ ගුණාත්මක බව පිළිබඳ තෘප්තිය | 9 |
| 6 රූප සටහන | : මන්මුනෙයි නිරිත කොට්ඨාසය තුළ අධ්‍යාපනයේ ගුණාත්මක බව පිළිබඳ තෘප්තිය | 9 |
| 7 රූප සටහන | : පෝරතිවුපත්තු නිරිත කොට්ඨාසය තුළ අධ්‍යාපනයේ ගුණාත්මක බව පිළිබඳ තෘප්තිය | 9 |
| 8 රූප සටහන | : අමතර පන්තිවලට යන සිසුන් | 10 |
| 9 රූප සටහන | : එරාවූර් කොට්ඨාසය තුළ අමතර පන්තිවලට යන සිසුන් | 10 |
| 10 රූප සටහ | : කෝරලෙයිපත්තු කොට්ඨාසය තුළ අමතර පන්තිවලට යන සිසුන් | 10 |
| 11 රූප සටහ | : මන්මුනෙයි නිරිත කොට්ඨාසය තුළ අමතර පන්තිවලට යන සිසුන් | 11 |
| 12 රූප සටහ | : පෝරතිවුපත්තු නිරිත කොට්ඨාසය තුළ අමතර පන්තිවලට යන සිසුන් | 11 |
| 13 රූප සටහන | : පහසුකම් පැවතීම හා භාවිතය | 12 |
| 14 රූප සටහන | : පාසල් විසින් ඉල්ලා සිටිනු ලබන අමතර ගෙවීම් | 13 |
| 15 රූප සටහන | : පාසල්වලට කරන අමතර ගෙවීම් සඳහා ලදු පත් නිකුත් කිරීම | 13 |
| 16 රූප සටහන | : පාසල් තුළ පවත්නා දඬුවම් පැමිණවීම ආශ්‍රිත ගැටලු | 14 |
| 17 රූප සටහන | : සිසුන්ට ලබා දෙන දඬුවම් වර්ග | 14 |
| 18 රූප සටහන | : පාසල් තුළ දී අසමාන ලෙස සැලකීම් සිදු වී ඇති අවස්ථා | 15 |
| 19 රූප සටහන | : පාසල් තුළ දී අපයෝජන සිදු වී ඇති අවස්ථා | 15 |
| 20 රූප සටහන | : ගුරුවරුන් සම්බන්ධ ගැටලු | 16 |
| 21 රූප සටහන | : ද්විතීය අධ්‍යාපන සේවා සම්පාදනය පිළිබඳ සමස්ත ශ්‍රේණිගත කිරීම් | 18 |
| 22 රූප සටහන | : වහා ම පියවර ගත යුතු අංශ | 19 |
| 23 රූප සටහන | : එරාවූර් නගර කොට්ඨාසය තුළ පවත්නා වහා ම පියවර ගත යුතු අංශ | 20 |
| 24 රූප සටහන | : කෝරලෙයිපත්තු කොට්ඨාසය තුළ පවත්නා වහා ම පියවර ගත යුතු අංශ | 20 |
| 25 රූප සටහන | : මන්මුනෙයි නිරිත කොට්ඨාසය තුළ පවත්නා වහා ම පියවර ගත යුතු අංශ | 21 |
| 26 රූප සටහන | : පෝරතිවුපත්තු නිරිත කොට්ඨාසය තුළ පවත්නා වහා ම පියවර ගත යුතු අංශ | 21 |


# කෙටි යෙදුම් මාලාව

| | |
|---|---|
| **ACLG** | සහකාර පළාත් පාලන කොමසාරිස් |
| **EU** | යුරෝපා සංගමය |
| **CEPA** | දරිද්‍රතා විශ්ලේෂණ කේන්ද්‍රය |
| **CSO** | සිවිල් සමාජ සංවිධානය |
| **CRC** | පුරවැසි වාර්තාපත |
| **eCRC** | විද්‍යුත් පුරවැසි වාර්තාපත |
| **DS** | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය |
| **DDE** | නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ |
| **GNDs** | ග්‍රාම නිලධාරි වසම් |
| **PS** | ප්‍රාදේශීය සභාව |
| **WRDS** | කාන්තා ග්‍රාම සංවර්ධන සමිතිය |
| **RDS** | ග්‍රාම සංවර්ධන සමිතිය |

# ස්තුතිය

මෙම අධ්‍යයනයට සහාය දීම සම්බන්ධයෙන් දරිද්‍රතා විශ්ලේෂණ කේන්ද්‍රය (CEPA) යුරෝපා සංගමයට සිය ස්තුතිය පුද කර සිටී. අධ්‍යයනය සඳහා මූල පුරන ලද්දේ කෑජ් ආයතනය ACTED ආයතනයේ හවුල්කාරිත්වය ඇතිව ක්‍රියාත්මක කරන "සමාජ සංවර්ධනය හා යහපාලනය එකිනෙකට සමගාමීව ඇති කිරීම: වඩාත් හොඳ සමාජ සේවාවන් සම්පාදනය කිරීම සඳහා සිවිල් සමාජ සංවිධාන හා රජයේ ආයතන අතර සහයෝගිතාව වර්ධනය කිරීම" පිළිබඳ ව්‍යාපෘතියේ කොටසක් ලෙස ය. පුරවැසි වාර්තාපත් සමීක්ෂණය සැලසුම් කිරීමේ දී හා ක්‍රියාත්මක කිරීමේ දී CEPA ආයතනය මූලිකත්වය කරනු ලැබීය.

මෙම අධ්‍යයනය සිදු කළ හැකි වූයේ මඩකලපුව, මොණරාගල හා මුලතිව් දිස්ත්‍රික්කවල දිස්ත්‍රික්ක ලේකම්වරුන්, අතිරේක ලේකම්වරුන්, ප්‍රාදේශීය ලේකම්වරුන්, සහකාර පළාත් පාලන කොමසාරිස්වරුන් (ACLGs), ප්‍රාදේශීය සභා ලේකම්වරුන් සහ මුලතිවු, මඩකලපුව හා මොණරාගල කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්, නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් හා නිලධාරීන් විසින් අපට ලබා දෙන ලද සහාය නිසයි.

CEPA ආයතනය මඩකලපුව දිස්ත්‍රික්කයේ දී මෙම අධ්‍යයනය සඳහා සහභාගී වූ පහත දැක්වෙන සිවිල් සමාජ සංවිධානවලට ද සිය ස්තුතිය පළ කර සිටී.

| අංක | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | ග්‍රාම නිලධාරි වසම | සිවිල් සමාජ සංවිධානයේ නම |
|---|---|---|---|
| 1 | මන්මුනෙයි නිරිත | කඩුක්කමුනෙයි | අදවන් ප්‍රජා මධ්‍යස්ථානය |
| 2 | මන්මුනෙයි නිරිත | අරසදිතිවු උතුර | කාන්තා ග්‍රාම සංවර්ධන සමිතිය |
| 3 | මන්මුනෙයි නිරිත | මුනෙයිකාඩු බටහිර | කාන්තා ග්‍රාම සංවර්ධන සමිතිය |
| 4 | මන්මුනෙයි නිරිත | මුනෙයිකාඩු උතුර | කාන්තා ග්‍රාම සංවර්ධන සමිතිය |
| 5 | මන්මුනෙයි නිරිත | කොක්කඩිචෝලෙයි | ග්‍රාම සංවර්ධන සමිතිය |
| 6 | මන්මුනෙයි නිරිත | මහිලඩිතිවු දකුණ | ග්‍රාම සංවර්ධන සමිතිය |
| 7 | කෝරලෙයිපත්තු දකුණ | කෝරකල්ලිමඩු | කාන්තා ග්‍රාම සංවර්ධන සමිතිය |
| 8 | කෝරලෙයිපත්තු දකුණ | කිරාන් නැගෙනහිර | කාන්තා ග්‍රාම සංවර්ධන සමිතිය |
| 9 | කෝරලෙයිපත්තු දකුණ | දේවපුරම් | නච්චතිරා කාන්තා පොකුරු මට්ටමේ සංගමය |
| 10 | කෝරලෙයිපත්තු දකුණ | තිකිලිවඩ්ඩෙයි | කාන්තා ග්‍රාම සංවර්ධන සමිතිය |
| 11 | කෝරලෙයිපත්තු දකුණ | වාහනේරි | ග්‍රාම සංවර්ධන සමිතිය |
| 12 | පෝරතිවුපත්තු | සෙල්වපුරම් | ග්‍රාම සංවර්ධන සමිතිය |
| 13 | පෝරතිවුපත්තු | වන්නිනගර් | ග්‍රාම සංවර්ධන සමිතිය |
| 14 | පෝරතිවුපත්තු | මාවෙට්කුඩා | ග්‍රාම සංවර්ධන සමිතිය |
| 15 | පෝරතිවුපත්තු | කෝවිල් පෝරතිවු බටහිර | කාන්තා ග්‍රාම සංවර්ධන සමිතිය |
| 16 | පෝරතිවුපත්තු | කනේසපුරම් | ග්‍රාම සංවර්ධන සමිතිය |
| 17 | පෝරතිවුපත්තු | සින්නවත්තෙයි | වල්ලුවර් ප්‍රජා මධ්‍යස්ථානය |
| 18 | එරාවූර් නගරය | අයියන්කර්නි මුස්ලිම් | ග්‍රාම සංවර්ධන සමිතිය |
| 19 | එරාවූර් නගරය | මීරාකර්නි | ග්‍රාම සංවර්ධන සමිතිය |
| 20 | එරාවූර් නගරය | මිච්නගර් | ග්‍රාම සංවර්ධන සමිතිය |

මෙම අධ්‍යයනය සාර්ථක කිරීම සඳහා තොරතුරු සම්පාදනය කරමින් දෙමව්පියන් හා සිසුන් ලබා දුන් අගනා දායකත්වය වෙනුවෙන් ද CEPA ආයතනය සිය කෘතඥතාව පළ කර සිටී.

# අන්තර්ගතය


**1. හැඳින්වීම** **1**

1.1. ව්‍යාපෘතිය 1

1.2. වාර්තාවේ විෂය පථය 1

1.3. අධ්‍යයනයේ අරමුණු 1

1.4. නියැදිකරණය 1

1.5. ක්‍රමවේදය 3

1.5.1. පුරවැසි වාර්තාපතක් යනු කුමක් ද? 3

1.5.2. විද්‍යුත් පුරවැසි වාර්තාපතක් (eCRC) යනු කුමක් ද? 4

1.5.3. විද්‍යුත් පුරවැසි වාර්තාපත සැලසුම් කිරීම 5

1.5.4. විද්‍යුත් පුරවැසි වාර්තාපත යොදා ගෙන සමීක්ෂණය කළ යුතු සේවාවන් හඳුනා ගැනීම 5

1.5.5. කාර්ය සාධන දර්ශක නිර්මාණය කිරීම 5

1.6. අධ්‍යයන ප්‍රදේශය 6

**2. ප්‍රධාන සොයා ගැනීම්** **7**

2.1. ද්විතීය අධ්‍යාපන ප්‍රවේශය 7

2.2. ද්විතීය අධ්‍යාපන සේවාවන් ආශ්‍රිත ගුණාත්මක බව හා තෘප්තිය 8

2.3. පහසුකම් 12

2.4. අමතර ගෙවීම් 12

2.3. වෙනත් අපහසුතා 13

**3. ද්විතීය අධ්‍යාපන සේවාවන් සඳහා ලබා දුන් සමස්ත ලකුණු ප්‍රමාණය** **17**

**4. නිර්දේශ** **19**

4.1. වැඩි දියුණු කළ යුතු සේවා අංශ 19

4.1.1. වහාම අවධානය යොමු කළ යුතු අංශ 19

4.1.2. වෙනත් සලකා බැලීම් 22

4.2. ඉදිරි මාවත 22

# 1. හැඳින්වීම

## 1.1. ව්‍යාපෘතිය

යුරෝපා සංගමය විසින් අරමුදල් සම්පාදිත *"සමාජ සංවර්ධනය හා යහපාලනය එකිනෙකට සමගාමීව ඇති කිරීම: වඩාත් හොඳ සමාජ සේවාවන් සම්පාදනය කිරීම සඳහා සිවිල් සමාජ සංවිධාන හා රජයේ ආයතන අතර සහයෝගිතාව වර්ධනය කිරීම"* ව්‍යාපෘතියේ අභිමතාර්ථය වන්නේ වඩාත් හොඳ ප්‍රවේශයන් ප්‍රවර්ධනය කිරීම හා රාජ්‍ය සේවාවන්හි ගුණාත්මක බව වැඩි දියුණු කිරීම සඳහා රජයේ ආයතන සමග සහයෝගී වීමට සිවිල් සමාජ සංවිධාන (CSOs) සතු හැකියාව ශක්තිමත් කිරීම හා වැඩි දියුණු කිරීම සහ ඒ අතර සේවා සම්පාදකයන්ගේ වග වීම සහතික කිරීම යි. ACTED ආයතනය සහ CEPA ආයතනය පහත දැක්වෙන ව්‍යාපෘති ප්‍රතිඵල සාක්ෂාත් කර ගැනීම සඳහා සහයෝගීව කටයුතු කරමින් සිටී. මෙම අධ්‍යයනය සමීක්ෂණයට ලක් කරන ලද රාජ්‍ය සේවා සම්පාදනය පිළිබඳ පාදක දත්ත සම්පාදනය කරයි. මෙම වසර අග දී ප්‍රගතිය නිරීක්ෂණය කිරීම සඳහා දෙවන අධ්‍යයනයක් සිදු කිරීමට සැලසුම් කර ඇති අතර එහි සොයා ගැනීම් 2018 දෙසැම්බර් මාසයේ දී ප්‍රකාශයට පත් කෙරෙනු ඇත.

පහත දැක්වෙන ප්‍රතිඵල (R1 සහ R2) සාක්ෂාත් කර ගැනීමේ කර්තව්‍යය ACTED ආයතනයට පැවරිණ:

- R1 සිවිල් සමාජ සංවිධානවලට සිය හැකියාවන් ක්‍රියාත්මක කිරීමට තිබෙන හැකියාව සහ ප්‍රාදේශීය සමාජ සංවර්ධන ක්‍රියාවලීන්හි ක්‍රියාකාරීව නිරත වීමට තිබෙන හැකියාව වැඩි දියුණු කෙරේ,
- R2 සහභාගිත්ව බහුපාර්ශ්වීය ප්‍රවේශයක් මගින් සමාජ සේවාවන් ආශ්‍රිත ප්‍රාදේශීය අවශ්‍යතා හා අඩුපාඩුකම් හඳුනා ගැනෙන අතර සිවිල් සමාජ සංවිධාන සහ රජයේ ආයතන විසින් විසඳුම් ලබා දීමට කටයුතු කෙරේ.

පහත දැක්වෙන ප්‍රතිඵලය (R3) සාක්ෂාත් කර ගැනීමේ කර්තව්‍යය CEPA ආයතනයට පැවරිණ:

- R3 සේවා සම්පාදකයන් ලවා වඩාත් හොඳින් වග වීම සඳහා සමාජ සේවා සම්පාදනය/ඒවායේ ගුණාත්මක බව නිරීක්ෂණය කිරීම වැඩි කිරීමේ කටයුතු ප්‍රවර්ධනය කෙරෙන අතර ප්‍රධාන ප්‍රවාහයට එක් කිරීම සඳහා යහභාවිතයන් ප්‍රචලිත කෙරේ.

මෙහි ප්‍රතිඵලයක් ලෙස CEPA ආයතනය ක්‍රියාකාරකම් ගණනාවකට මුල පිරිය යුතු අතර ඒවා පහත දැක්වේ:

- විවිධ මට්ටම්වල රාජ්‍ය සේවා සම්පාදකයන් හඳුනා ගැනීම,
- ඉලක්ක කෙරෙන සිවිල් සමාජ සංවිධානවලින් සංගණනකරුවන් තෝරා ගැනීම,
- සංගණනකරුවන්ට පුරවැසි වාර්තාපත් ක්‍රියාවලිය පිළිබඳ පුහුණුවක් ලබා දීම,
- ප්‍රශ්නාවලි සකස් කිරීමට හා දත්ත රැස් කිරීමට පහසුකම් සැපයීම,
- ප්‍රතිඵල රජයේ ආයතන වෙත යොමු කිරීම සහ සේවාවන් ආශ්‍රිත අඩුපාඩුකම් සැපිරීම සඳහා සැලසුම් සකස් කර වඩාත් හොඳ සේවාවන් සම්පාදනය කිරීම පිණිස ඒවාට සහාය වීම.

## 1.2 වාර්තාවේ විෂය පථය

මෙම වාර්තාව එරාවූර්පත්තු, පෝරතිවුපත්තු, මන්මුනෙයි නිරිත හා කෝරලෙයිපත්තු දකුණ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල ක්‍රියාත්මක කරන ලද විද්‍යුත් පුරවැසි වාර්තාපත් සමීක්ෂණය පදනම් කර ගෙන **මඩකලපුව දිස්ත්‍රික්කයේ ද්විතීය අධ්‍යාපන සේවා සම්පාදනය** සම්බන්ධයෙන් විද්‍යුත් පුරවැසි වාර්තාපත කළ සොයා ගැනීම් ආවරණය කරයි.

## 1.3. අධ්‍යයනයේ අරමුණු

අධ්‍යයනයේ විශේෂිත අරමුණු මෙසේ වේ:

(i) රාජ්‍ය සේවාවන් වෙත පවත්නා ප්‍රවේශය, ඒවායේ ගුණාත්මක බව හා එම සේවාවන් සැබවින් පරිභරණය කරන්නන්ගේ තෘප්තිය තක්සේරු කිරීමේ මෙවලමක් ලෙස සහ සමාජීය වග වීම හා විනිවිද භාවය සාක්ෂාත් කර ගැනීමේ මෙවලමක් ලෙස පුරවැසි වාර්තාපත යොදා ගැනීම,

(ii) මෙම අධ්‍යයනයේ සොයා ගැනීම් ක්‍රියාකාරීව ප්‍රචලිත කිරීම සහ මෙහෙයුම් ප්‍රතිපත්ති සම්බන්ධයෙන් විශ්ලේෂණයක යෙදීම හා ප්‍රතිසංස්කරණ පියවරයන් ඉටු කර ගැනීම සඳහා ඒවා යොදා ගැනීම,

(iii) වෙනත් දිස්ත්‍රික්කවල වෙනත් රාජ්‍ය ආයතන තුළ මීට සමාන මුල පිරීම් ක්‍රියාත්මක කිරීම සඳහා සැබෑ පරිභරණය කරන්නන්ගේ මෙම අත්දැකීම ඉදිරිපත් කිරීම.

## 1.4. නියැදිකරණය

සේවාවක් භාවිත කරන ජන ප්‍රතිශතය, සේවාවක් සම්බන්ධයෙන් තෘප්තිමත් ජන ප්‍රතිශතය යනාදි තොරතුරු උකහා ගනිමින් යම් අධ්‍යයන ප්‍රදේශයක සේවා සම්පාදනයේ කාර්ය සාධනය තක්සේරු කිරීම සඳහා යොදා ගත හැකි ප්‍රවේශ දෙකක් පවතී. එක් ක්‍රමයක් වන්නේ එම කණ්ඩායමේ

සෑම පුද්ගලයෙකුගෙන් ම විමසා අවශ්‍ය තොරතුරු රැස් කර ගෙන අනතුරුව සොයා ගැනීම් සම්පිණ්ඩනය කිරීම යි. මෙම විධික්‍රමය පූර්ණ ගණන් ගැනීම නොහොත් සංගණනය ලෙස හඳුන්වනු ලැබේ. මෙම තොරතුරු උකහා ගතහැකි තවත් ක්‍රමයක් වන්නේ වඩාත් විශාල ජන කණ්ඩායමකින් උපකුලකයක් තෝරා ගෙන එම උපකුලකයෙන් අදාළ තොරතුරු රැස් කර ගැනීම යි. මෙම ක්‍රමය නියැදිකරණය ලෙසත් තෝරාගත් උපකුලකය නියැදිය ලෙසත් හඳුන්වනු ලැබේ. වඩාත් පිරිවැය ඵලදායක වූ නිසා සහ එතරම් ශ්‍රම සූක්ෂ්මතාවක් අවශ්‍ය නොවූ නිසා මෙම අධ්‍යයනය සඳහා නියැදිකරණ සමීක්ෂණය වඩාත් සුදුසු විය.

දත්තවල විශ්වසනීයත්වය හා නිරවද්‍යතාව නියැදිය තෝරා ගැනෙන ආකාරය මත රඳා පවතී. හොඳ ම නියැදියක් වන්නේ එය විසින් අධ්‍යයන ප්‍රදේශය තුළ ජීවත් වන සමස්ත ජනගහනයේ ම විවිධතා හා ලක්ෂණ නියෝජනය කෙරෙන විට ය.


විද්‍යුත් පුරවැසි වාර්තාපත සේවාවන් දෙවර්ගයක් සම්බන්ධයෙන් ක්‍රියාත්මක කෙරිණ. එකක් ද්විතීය නිදහස් අධ්‍යාපනය ද අනෙක ප්‍රාදේශීය සභා විසින් සැපයෙන සේවා ද විය. විද්‍යුත් පුරවැසි වාර්තාපත ACTED ආයතනය විසින් මුලතිවු, මඩකලපුව හා මොණරාගල දිස්ත්‍රික්කවලින් තෝරා ගන්නා ලද ග්‍රාම නිලධාරි වසම් 60ක් ආවරණය කරන ලදී. සමීක්ෂණය සඳහා යොදා ගැනුණු නියැදියේ විශාලත්වය තෝරා ගත් ග්‍රාම නිලධාරි වසම් 60න් කුටුම්බ 1,200ක් නොහොත් ඒ ඒ දිස්ත්‍රික්කයෙන් තෝරා ගත් ග්‍රාම නිලධාරි වසම් 20න් කුටුම්බ 400ක් විය යුතු යැයි තීරණය කෙරිණ. ඒ ඒ ග්‍රාම නිලධාරි වසම් 20න් තෝරා ගැනුණු කුටුම්බ 400 අනතුරුව ඒ ඒ ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ සැබෑ සේවාලාභීන් සංඛ්‍යාව අනුව බෙදා වෙන් කරන ලදි.

මඩකලපුව, මුලතිවු හා මොණරාගල යන දිස්ත්‍රික්ක තුනේ දී ම නියැදිකරණ ක්‍රියාවලිය සම්පූර්ණ කරන ලද්දේ අදියර ගණනාවකිනි. පළමු අදියරේ දී ග්‍රාම නිලධාරි වසම තුළ පවත්නා කුටුම්බ පිළිබඳ දත්ත පදනම් කර ගෙන ඒ ඒ ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ සිවිල් සමාජ සංවිධාන සාමාජිකයන් විසින් පාසල් යන වයසේ (5 සිට 13 ශ්‍රේණිය දක්වා) දරුවන් සිටින කුටුම්බ හඳුනා ගෙන ලැයිස්තුගත කෙරිණ. සමීක්ෂණය සඳහා යොදාගත් කුටුම්බ නියැදිය ඒ ඒ ග්‍රාම නිලධාරි වසමෙන් අපේක්ෂිත නියැදියේ විශාලත්වය සැලකිල්ලට ගනිමින් අහඹු ලෙස තෝරා ගැනිණ. මේ අතර ප්‍රාදේශීය සභා සේවාවන් පිළිබඳ සමීක්ෂණය සඳහා තෝරාගත් නියැදිය ද මෙම කුටුම්බ යටත් පිරිසෙයින් ප්‍රාදේශීය සභා විසින් සම්පාදනය කෙරෙන එක් රාජ්‍ය සේවාවක් වත් භාවිත කරන්නේ ය යන නිර්ණායකය පදනම් කර ගෙන ඒ ඒ ග්‍රාම නිලධාරි වසම තුළ ක්‍රියාකාරී සිවිල් සමාජ සංවිධාන විසින් හඳුනා ගැනුණු ඉහත සඳහන් කරන ලද කුටුම්බ අතරින් ම උකහා ගැනිණ. ඒ ඒ ග්‍රාම නිලධාරි වසම තුළ නියැදිකරණ ක්‍රියාවලිය සඳහා මුල පුරන ලද්දේ ජනවාර්ගික අනුපාතයන් සහ ග්‍රාම නිලධාරි වසම තුළ පවත්නා සියලු ගම්මාන නියෝජනය වන පරිදි වඩාත් පුළුල් ආවරණයක් සාක්ෂාත් කර ගත යුතු බව සිත තබා ගනිමිනි. සමස්තයක් ලෙස විද්‍යුත් පුරවැසි වාර්තාපත සඳහා කුටුම්බ 1,240ක් (මඩකලපුව දිස්ත්‍රික්කයෙන් 414ක්, මොණරාගල දිස්ත්‍රික්කයෙන් 418ක් සහ මුලතිවු දිස්ත්‍රික්කයෙන් 408ක්) සම්බන්ධ කර ගැනිණ; ගුණාත්මක බව පිළිබඳ සියලු පරීක්ෂාවන්ගෙන් පසුව විශ්ලේෂණය සඳහා ඒ අතරින් තෝරා ගැනුණු වලංගු නියැදිය දිස්ත්‍රික්ක තුනේ ග්‍රාම නිලධාරි වසම් 60න් කුටුම්බ 1,200ක් විය.

නියැදිකරණයට මුල පුරන ලද්දේ පහත දැක්වෙන නියැදිකරණ ආකෘතිය පදනම් කර ගෙන ය:

| ජනගහනය (කුටුම්බ) | කුටුම්බ පදනම් කර ගෙන තෝරා ගත යුතු නියැදියේ විශාලත්වය (විශ්වසනීයත්වයේ මට්ටම 95%) | කුටුම්බ පදනම් කර ගෙන තෝරා ගත යුතු නියැදියේ විශාලත්වය (විශ්වසනීයත්වයේ මට්ටම 90%) |
|---|---|---|
| 100 | 80 | 66 |
| 500 | 217 | 141 |
| 1000 | 278 | 164 |
| 5,000 | 357 | 189 |
| 10,000 | 370 | 192 |
| 30,000 | 379 | 195 |
| 50,000 | 381 | 195 |
| 100,000 | 383 | 196 |
| 200,000 | 383 | 196 |

දිස්ත්‍රික්කයේ නියදිකරණයෙන් ආවරණය වන ප්‍රදේශ හඳුනාගැනීමට චන්ද්‍රිකා ඡායාරූප යොදා ගන්නා ලදී.




## 1.5. ක්‍රමවේදය

### 1.5.1 පුරවැසි වාර්තාපතක් යනු කුමක් ද?

පුරවැසි වාර්තාපත (CRC) යනු රාජ්‍ය සේවාවන්ගේ කාර්ය සාධනය පිළිබඳව ක්‍රමානුකූල සහ සැබවින් පරිහරණය කරන්නන්ගේ ප්‍රතිචාර ලබා ගත හැකි සරල නමුත් බලගතු මෙවලමකි. එය සැබවින් පරිහරණය කරන්නන්ගෙන් රාජ්‍ය සේවාවන්හි ගුණාත්මක බව හා ප්‍රමාණවත් බව පිළිබඳ ප්‍රතිචාර රැස් කර ගන්නා සහභාගිත්ව සමීක්ෂණයකි. පුරවැසි වාර්තාපත සේවා සම්පාදකයන් සමග සංවාදයක යෙදීමට සහ රාජ්‍ය සේවා සම්පාදනය වැඩි දියුණු කිරීම සම්බන්ධයෙන් ඔවුන් ලවා වග වීමට ප්‍රජාවන්, සිවිල් සමාජ සංවිධාන හෝ පළාත් පාලන ආයතන වෙත තර්කානුකූල පදනමක් හා ප්‍රායෝගික ප්‍රවේශයක් සම්පාදනය කරයි. පුරවැසි වාර්තාපත මුලින් ක්‍රියාත්මක කෙරුණේ නාගරික පරිසරයන් තුළ වුවත් දැන් එය රාජ්‍ය සේවා සම්පාදනයේ තත්ත්වය අවබෝධ කර ගැනීම සඳහා භූගෝලීය පසුබිම් සහ ආංශික වාතාවරණයන් ගණනාවක දී ම යොදා ගැනේ.

පුරවැසි වාර්තාපත ප්‍රතිලාභ ගණනාවක් අත් කර දෙයි. තමන් සම්පාදනය කරන රාජ්‍ය සේවාවන් නිවැරදි හා කාර්යක්ෂම සාමාජිකයන් වෙත ළඟා වන්නේ දැයි සොයා ගැනීමේ පිරිවැය ඵලදායක ක්‍රමයක් එය සේවා සම්පාදකයන් වෙත පිරිනමයි. එමෙන් ම එය තමන්ට ලැබෙන සේවාවන්ගේ ගුණාත්මක බව, කාර්යක්ෂමතාව හා ප්‍රමාණවත් බව සම්බන්ධයෙන් ප්‍රතිචාර සහ සේවා සම්පාදකයන් සමග ගනුදෙනු කරන විට තමන් මුහුණ දෙන ප්‍රශ්න පළාත් පාලන ආයතන වෙත ඉදිරිපත් කිරීම සඳහා අවස්ථාවක් රාජ්‍ය සේවාවන් පරිහරණය කරන්නන් වෙත පිරිනමයි. විවිධ සේවා සම්පාදකයන් සිටින ප්‍රදේශවල දී විවිධ සේවාවන් සම්බන්ධයෙන් පරිහරණය කරන්නන්ගේ ශ්‍රේණිගත කිරීම් සසඳා බැලීමට හැකියාව ලැබේ. මෙලෙස (සේවා පරිහරණය කරන්නන්ගේ තෘප්තිය පදනම් කර ගෙන) සිදු වන තක්සේරුව අනතුරුව යම් ප්‍රදේශයක් සම්බන්ධයෙන් සේවා සම්පාදකයන්ගේ කාර්ය සාධනය මැන බැලිය හැකි 'වාර්තාපතක්' බවට පත් වේ. පුරවැසි වාර්තාපතෙන් පිළිබිඹු වන්නේ රාජ්‍ය සේවාවන් පරිහරණය කරන්නන්ගේ සැබෑ අත්දැකීම් නිසා පුරවැසි වාර්තාපත රාජ්‍ය සේවාවන් පිළිබඳව කෙරෙන මත විමසුම් සමග පටලවා නොගත යුතු ය. උදාහරණයක් ලෙස පුරවැසි වාර්තාපත් යොදා ගන්නා සමීක්ෂණවල දී ඉලක්ක කර ගැනෙන්නේ යම් යම් සේවාවන් භාවිත කර ඇති සහ/හෝ අදාළ රාජ්‍ය ආයතන සමග ගනුදෙනු කර ඇති පුද්ගලයන් පමණකි.

රටවල් 20කට වැඩි ගණනක දී ප්‍රාදේශීය හා ජාතික ආණ්ඩු සහ සිවිල් සමාජ සංවිධානවල පටන් සංවර්ධන හවුල්කරුවන් දක්වා වූ විවිධ ආයතන විසින් පුරවැසියන් සම්බන්ධ කර ගැනීමේ හා සේවාවන් වැඩි දියුණු කිරීමේ මෙවලමක් ලෙස පුරවැසි වාර්තාපත් යොදා ගනු ලැබ ඇත. මෙම මෙවලම සාමාන්‍යයෙන් දත්ත උත්පාදනය කරන්නේ පුරවැසියන් සහ ආණ්ඩුව එකිනෙකාට හමු වන තැන දී නිසා බොහෝ බලපෑම් ක්ෂේත්‍රවල දී එය ප්‍රයෝජනයට ගත හැකි ය. උදාහරණයක් ලෙස එයට රාජ්‍ය ප්‍රතිපත්ති හා වැඩසටහන් පෝෂණය කිරීමේ, පාලන ක්‍රියාවලි හා සේවා සම්පාදන යන්ත්‍රණයන් නැවත සකස් කිරීමේ සහ රාජ්‍ය හා ප්‍රජා ආයතන ප්‍රතිව්‍යුහගත කිරීමේ පදනම බවට පත් විය හැකි ය.

පුරවැසි වාර්තාපතේ එක් කැපී පෙනෙන ලක්ෂණයක් වන්නේ හඬක් නොනැගෙන ප්‍රජාවන්ට සිය අදහස් පළ කිරීම සඳහා ඉඩක් සලසා දීමට ඊට තිබෙන හැකියාව යි. මඩකලපුව, මොණරාගල හා මුලතිවු දිස්ත්‍රික්කවල පිහිටි ඉතා දුර බැහැර හා ප්‍රමාණවත් සේවා සම්පාදනයක් සිදු නොවන ප්‍රදේශවල ජීවත් වන ප්‍රජාවන් සම්බන්ධ කර ගැනීම කෙරෙහි අවධානය යොමු කළ මෙම සුවිශේෂ අධ්‍යයනයේ දී සිදු වූයේ එය යි. අභිමතාර්ථය වූයේ තෝරා ගැනීම් තමන් විසින් ම කරනු ලැබීම සඳහා, තම අවශ්‍යතාවන් සපුරා ගැනීම සඳහා සහ ආත්ම විශ්වාසයෙන් යුතුව තිරසර ජීවිතයක් ගත කිරීම සඳහා ප්‍රජාවන් බල ගැන්වීම යි. මෙම අධ්‍යයනයේ අභිමතාර්ථය සාක්ෂාත් කර ගැනීම සඳහා CEPA ආයතනය ප්‍රජා පාදක පර්යේෂණ ඔස්සේ හඳුනා ගැනුණු ප්‍රමුඛතාව දෙන ලද සේවාවන් තක්සේරු කිරීම කෙරෙහි අවධානය යොමු කළේ ය. මෙහි අරමුණ වූයේ පුරවැසියන්ට හිතැති සහ අයිතිවාසිකම් පදනම් කර ගත් දැක්මකින් යුතුව දැනට පවත්නා භාවිතයන්ට හා ප්‍රතිපත්තිවලට බලපෑම් කිරීම යි.

## 1.5.2. විද්‍යුත් පුරවැසි වාර්තාපතක් (eCRC) යනු කුමක් ද?

විද්‍යුත් පුරවැසි වාර්තාපත (eCRC) යනු නවීන තාක්ෂණය හා පහසුව ප්‍රයෝජනයට ගනිමින් පුරවැසි වාර්තාපත් ක්‍රියාත්මක කිරීමේ විප්ලවීය ප්‍රවේශයකි. විද්‍යුත් පුරවැසි වාර්තාපත ඇන්ඩ්‍රොයිඩ් මෙහෙයුම් පද්ධතිය පදනම් කර ගත් ජංගම දුරකථන මෘදුකාංග යෙදුමක් මගින් විශ්වසනීය ආකාරයෙන් පුරවැසි ප්‍රතිචාර රැස් කිරීමටත් රැස් කර ගත් තොරතුරු ඒ මොහොතේ ම විශ්ලේෂණය කිරීමට හා වාර්තා කිරීමටත් හැකියාව ලබා දෙයි. විද්‍යුත් පුරවැසි වාර්තාපත් ක්‍රියාවලිය අංග කිහිපයකින් සමන්විත වේ:

**(a) සමීක්ෂණය පැවැත්වීම**

ජංගම දුරකථන මෘදුකාංග යෙදුමක් යොදා ගනිමින් ටැබ්ලට් පරිගණකයක් ඔස්සේ මහජන ප්‍රතිචාර හා අත්දැකීම් පිළිබඳ විද්‍යාත්මක නියැදි සමීක්ෂණයක් පවත්වනු ලැබේ. ජංගම දුරකථන/ටැබ්ලට් පරිගණකවල පවත්නා GPS සෙවුම් පද්ධතිය දත්ත රැස් කර ගත් ස්ථානය පෙන්නුම් කරන නිසා දත්ත රැස් කිරීමේ විශ්වසනීයත්වය වැඩි දියුණු වේ.

**(b) තත්ත්ව පාලනය සඳහා දුරස්ථ නිරීක්ෂණය**

වෙබ් ජාලය පදනම් කර ගත් සමීක්ෂණ කළමනාකරන මොඩියුලය ඒ මොහොතේ ම සමීක්ෂණයේ ප්‍රගතිය සොයා බැලීමට සමීක්ෂණ කළමනාකරුවන්ට හැකියාව ලබා දෙයි. මෙම මොඩියුලය දුරස්ථ නිරීක්ෂණයට සහ සමීක්ෂණ ක්‍රියාකාරකම් කළමනාකරණය කිරීමට හැකියාව ලබා දෙන අතර එම නිසා වැඩි තත්ත්ව පාලනයක් කළ හැකි බව සහතික කරයි.

**(c) දත්ත විශ්ලේෂණය**

විද්‍යුත් පුරවැසි වාර්තාපත් ක්‍රියාවලියේ කොටසක් ලෙස නිර්මාණය කරන ලද ඔන්ලයින් මෙවලම් පුවරුව (Dash board) හා දත්ත විශ්ලේෂණ මෙවලම් විවිධ කණ්ඩායම්වල (උදා. ප්‍රතිපත්ති සම්පාදකයන්, පරිපාලකයන්, දේශපාලන නියෝජිතයන් හා පුරවැසියන් යනාදි) තොරතුරු අවශ්‍යතා සපුරයි. සමීක්ෂණයේ ප්‍රතිඵල ඉදිරිපත් කෙරෙන්නේ පහසුවෙන් අවබෝධ කර ගත හැකි ප්‍රස්තාර, වගු හා සිතියම් මගිනි. කාර්ය සාධන මට්ටම් පහසුවෙන් නිගමනය කිරීමට පහසුකම් සැපයීම සඳහා සරල වර්ණ සංකේත යොදා ගනු ලැබේ.

විද්‍යුත් පුරවැසි වාර්තාපත වාර්තාකරණය සඳහා ටැබ්ලට් පරිගණක හා නවීන තාක්ෂණය යොදා ගන්නා නිසා එහි වාසි කිහිපයක් පවතී.

- එය ඉතා නිවැරදි දත්ත උත්පාදනය කරයි.
- ක්ෂණික ප්‍රතිඵල ලබා දෙයි.
- සමීක්ෂණය පැවැත්වෙන භූගෝලීය ස්ථානයේ සිතියමක් මත දත්ත/ප්‍රතිඵල විදහා දැක්වීමට හැකියාව ලබා දෙයි.
- එක් වරක් ආයෝජන පිරිවැය දරා ක්‍රියාකාරකම නැවත නැවතත් කිරීමට ඉඩ සලසා දෙන නිසා එය වඩාත් පිරිවැය ඵලදායක ය.

මෙම අධ්‍යයනයේ අභිමතාර්ථය පිණිස මඩකලපුව, මොණරාගල හා මුලතිවු යන ඒ ඒ දිස්ත්‍රික්කවල තෝරා ගත් ග්‍රාම නිලධාරි වසම් 20ක විද්‍යුත් පුරවැසි වාර්තාපත් සමීක්ෂණය පැවැත්වීමට සැලසුම් කරනු ලැබිණ. සමීක්ෂණය සැලසුම් කරන ලද්දේ අධ්‍යයනය සඳහා හඳුනා ගත් ප්‍රදේශවල ප්‍රාදේශීය සභා සේවා සම්පාදනය සහ ද්විතීය අධ්‍යාපන සේවාවන්හි තත්ත්වය ආවරණය කිරීම සඳහා ය. සමීක්ෂණයේ කාල සීමාව සහ අනෙක් කාර්ය සම්පාදන කටයුතු පිළිබඳව අවසන් තීරණයකට එළඹුණේ අදාළ දිස්ත්‍රික්කවල දිස්ත්‍රික්ක ලේකම්වරුන්, කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් හා ප්‍රාදේශීය සභා ලේකම්වරුන්ගෙන් උපදෙස් ලබා ගනිමිනි. සමීක්ෂණය ක්‍රියාත්මක කරන ලද්දේ ඒ ඒ ග්‍රාම නිලධාරි වසම් නියෝජනය කරන සිවිල් සමාජ සංවිධාන (CSO) කණ්ඩායමක් විසිනි. දිස්ත්‍රික්ක තුන තුළ විද්‍යුත් පුරවැසි වාර්තාපත් සමීක්ෂණ ක්‍රියාත්මක කිරීම සඳහා CEPA පර්යේෂකයන්ගේ සහ ACTED ආයතනයේ ක්ෂේත්‍ර නිලධාරීන්ගේ සෘජු අධීක්ෂණය යටතේ CEPA ආයතනය විසින් සිවිල් සමාජ සංවිධාන සාමාජිකයන් කණ්ඩායම සම්පත් පුද්ගල සංචිතයක් ලෙස පුහුණු කරන ලදි.

### 1.5.3. විද්‍යුත් පුරවැසි වාර්තාපත සැලසුම් කිරීම

මෙම අධ්‍යයනයේ අභිමතාර්ථය පිණිස මඩකලපුව, මොණරාගල හා මුලතිවු යන ඒ ඒ දිස්ත්‍රික්කවල තෝරා ගත් ග්‍රාම නිලධාරි වසම් 20ක විද්‍යුත් පුරවැසි වාර්තාපත් සමීක්ෂණය පැවැත්වීමට සැලසුම් කරනු ලැබිණ. සමීක්ෂණය සැලසුම් කරන ලද්දේ අධ්‍යයනය සඳහා හඳුනා ගත් ප්‍රදේශවල ප්‍රාදේශීය සභා සේවා සම්පාදනය සහ ද්විතීය අධ්‍යාපන සේවාවන්හි තත්ත්වය ආවරණය කිරීම සඳහා ය. සමීක්ෂණයේ කාල සීමාව සහ අනෙක් කාර්ය සම්පාදන කටයුතු පිළිබඳව අවසන් තීරණයකට එළඹුණේ අදාළ දිස්ත්‍රික්කවල දිස්ත්‍රික්ක ලේකම්වරුන්, කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් හා ප්‍රාදේශීය සභා ලේකම්වරුන්ගෙන් උපදෙස් ලබා ගනිමිනි. සමීක්ෂණය ක්‍රියාත්මක කරන ලද්දේ ඒ ඒ ග්‍රාම නිලධාරි වසම් නියෝජනය කරන සිවිල් සමාජ සංවිධාන (CSO) කණ්ඩායමක් විසිනි. දිස්ත්‍රික්ක තුන තුළ විද්‍යුත් පුරවැසි වාර්තාපත් සමීක්ෂණ ක්‍රියාත්මක කිරීම සඳහා CEPA පර්යේෂකයන්ගේ සහ ACTED ආයතනයේ ක්ෂේත්‍ර නිලධාරීන්ගේ සෘජු අධීක්ෂණය යටතේ CEPA ආයතනය විසින් සිවිල් සමාජ සංවිධාන සාමාජිකයන් කණ්ඩායම සම්පත් පුද්ගල සංචිතයක් ලෙස පුහුණු කරන ලදි.

### 1.5.4. විද්‍යුත් පුරවැසි වාර්තාපත යොදා ගෙන සමීක්ෂණය කළ යුතු සේවාවන් හඳුනා ගැනීම

ප්‍රජාව සහ සිවිල් සමාජ සංවිධාන සාමාජිකයන් සමග පැවැත්වූ ඉලක්ක කණ්ඩායම් සාකච්ඡා (FGDs) අතරතුර දී ගැටලු සහිත සහ දියුණු කිරීමේ මූලික අවශ්‍යතාව පවතින ක්ෂේත්‍ර ලෙස ඉස්මතු වූයේ (i) ප්‍රාදේශීය සභා සේවා සහ (ii) ද්විතීය අධ්‍යාපන සේවා (5 වසර13 වසර) සම්පාදනය යි. මෙම ප්‍රමුඛතා, ACTED ග්‍රාම සංවර්ධන සැලසුම්වල (VDPs) විස්තර කර ඇති ප්‍රමුඛතාවන් සමග ද ගැළපේ.

මේවා අතරින් වැඩි දියුණු කළ යුතු ප්‍රමුඛතා ක්ෂේත්‍ර හඳුනා ගැනුණේ ප්‍රජාව සහ සිවිල් සමාජ සංවිධාන නියෝජිතයන් විසින් කරන ලද ශ්‍රේණිගත කිරීම් යොදා ගනිමිනි.

අධ්‍යාපන සේවාවන් සම්බන්ධයෙන් ගත් කල ප්‍රජාව සමග එක්ව මුල පුරන ලද ඉලක්ක කණ්ඩායම් සාකච්ඡා ඔස්සේ ද්විතීය අධ්‍යාපනය ප්‍රමුඛතාවක් ලෙස හඳුනා ගන්නා ලදි.

### 1.5.5. කාර්ය සාධන දර්ශක නිර්මාණය කිරීම

දිස්ත්‍රික්ක තුනේ ප්‍රජා කණ්ඩායම්, කලාප අධ්‍යාපන කාර්යාලවල නිලධාරීන් හා පළාත් පාලන බලධාරීන් සමග පැවැත්වූ උපදෙස් විමසීම් මාලාවකින් පසුව ද්විතීය අධ්‍යාපන සේවාවන්ට සම්බන්ධිතව විශේෂිත දර්ශක කට්ටලයක් හඳුනා ගන්නා ලදි. ද්විතීය අධ්‍යාපන සේවා සම්පාදනයේ කාර්ය සාධනය තක්සේරු කිරීම සඳහා පහත දැක්වෙන කාර්ය සාධන දර්ශක තෝරා ගන්නා ලදි:

| ද්විතීය අධ්‍යාපන සේවා සම්පාදනයේ පැතිකඩවල් | දර්ශක |
|---|---|
| ප්‍රවේශය | • ග්‍රාම නිලධාරි වසම තුළ/පිටත පාසල්වලට යාම<br>• නිතිපතා පාසල් යාම<br>• පාසල් නොයාමට හේතු<br>• අමතර පන්තිවලට යාම |
| ගුණාත්මක බව | • ගුණාත්මක බව සම්බන්ධ තෘප්තිය |
| පහසුකම් | • පැවතීම<br>• තෘප්තිය |
| ගුරුවරු | • අවශ්‍ය ගුරුවරු සිටීම<br>• ඉගැන්වීමේ ගුණාත්මක බව<br>• ගුරුවරුන්ගේ හැසිරීම<br>• ඉගැන්වීම් ප්‍රවේශය |
| අපහසුතා | • දඬුවම්<br>• අපයෝජන<br>• අසමාන ලෙස සැලකීම්<br>• සැඟවුණු වියදම් |

## 1.6. අධ්‍යයන ප්‍රදේශය

මඩකලපුව දිස්ත්‍රික්කයේ දී මෙම අධ්‍යයනය එරාවූර්පත්තු, පෝරතිවුපත්තු, මන්මුනෙයි නිරිත හා කෝරලෙයිපත්තු දකුණ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල ප්‍රාදේශීය සභා සහ කලාප අධ්‍යාපන කාර්යාල යටතේ පවත්නා ප්‍රදේශ ගණනාවක් ආවරණය කරන බව පහත වගුවෙන් පෙනේ.


| ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය / ප්‍රාදේශීය සභාව / කලාප අධ්‍යාපන කාර්යාලය | ග්‍රාම නිලධාරි වසම් | ගම්මාන සංඛ්‍යාව | කුටුම්බ සංඛ්‍යාව |
|---|---|---|---|
| එරාවූර්පත්තු ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය / එරාවූර්පත්තු ප්‍රාදේශීය සභාව / මඩකලපුව මධ්‍යම කලාප අධ්‍යාපන කාර්යාලය | මීරාකර්නි | 9 | 1485 |
| | මිච්නගර් | 7 | 2063 |
| | අයියන්කර්නි මුස්ලිම් | 3 | 840 |
| පෝරතිවුපත්තු ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය / පෝරතිවුපත්තු ප්‍රාදේශීය සභාව / වෙල්ලාවේලි පත්තිරුප්පු කලාප අධ්‍යාපන කාර්යාලය | සින්නවත්තෙයි | 3 | 435 |
| | කනේසපුරම් | 1 | 420 |
| | කෝවිල් පෝරතිවු බටහිර | 1 | 415 |
| | වන්නිනගර් | 1 | 409 |
| | මාවෙයිකුඩා | 3 | 434 |
| | සෙල්වපුරම් | 1 | 337 |
| මන්මුනෙයි නිරිත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය / මන්මුනෙයි දකුණ ප්‍රාදේශීය සභාව / පඩ්ඩිප්පලෙයි මඩකලපුව බටහිර කලාප අධ්‍යාපන කාර්යාලය | කඩුක්කමුනෙයි | 5 | 480 |
| | අරසදිතිවු උතුර | 2 | 308 |
| | මහිලඩිතිවු දකුණ | 3 | 576 |
| | මුනෙයිකාඩු බටහිර | 4 | 327 |
| | මුනෙයිකාඩු උතුර | 2 | 369 |
| | කොක්කඩිචෝලෙයි | 3 | 586 |
| | කිරාන් නැගෙනහිර | 3 | 1197 |
| | කෝරකල්ලිමඩු | 3 | 677 |
| | දේවපුරම් | 2 | 656 |
| | තිකිලිවඩ්ඩෙයි | 5 | 423 |
| කෝරලෙයිපත්තු දකුණ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය / ඔඩ්ඩමාවඩි ප්‍රාදේශීය සභාව / කල්කුඩා කලාප අධ්‍යාපන කාර්යාලය | වාහනේරි | 5 | 462 |

# 2. ප්‍රධාන සොයා ගැනීම්

## 2.1. ද්විතීය අධ්‍යාපන ප්‍රවේශය

පාසල් යාම පිළිබඳ විද්‍යුත් පුරවැසි වාර්තාපත් සමීක්ෂණයේ දත්තවලින් අනාවරණය වූයේ පහත 1 රූප සටහනේ දක්වා ඇති පරිදි පාසල් ළමයින් බොහෝ දෙනෙකු තමන්ගේ ග්‍රාම නිලධාරි වසම් තුළ පිහිටා තිබෙන පාසල්වලට යන බව සහ ග්‍රාම නිලධාරි වසම්වලින් පිටත පිහිටි පාසල්වලට වැඩි වශයෙන් ම යන්නේ පෝරතිවුපත්තු කොට්ඨාසයේ ළමයින් බව යි (49% ප්‍රතිශතයක් කොට්ඨාසයෙන් පිටත පාසල්වලට යන බව වාර්තා විය).


**1 රූප සටහන: තමන්ගේ ග්‍රාම නිලධාරි වසම තුළ සහ පිටත පිහිටි පාසල්වලට යාම**




තමන්ගේ ග්‍රාම නිලධාරි වසමෙන් පිටත පිහිටි පාසල්වලට යාමට හේතු විමසා බලන විට පෙනී ගියේ 2 රූප සටහනේ දක්වා ඇති පරිදි ප්‍රවේශය පිළිබඳ ගැටලු ගණනාවක් පැවති බව යි. උදාහරණයක් ලෙස ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස හතරේ ම ද්විතීය පාසල් සිසුන් තමන්ගේ ග්‍රාම නිලධාරි වසමෙන් පිටත පිහිටි පාසල්වලට යාමට හේතු ලෙස පෙන්වා දුන්නේ තමන්ගේ වසමේ පාසල්වල පන්ති පැවැත්වෙන්නේ 5 ශ්‍රේණිය දක්වා පමණක් බව සහ පහසුකම් නොමැති බව යි. කෝරලෙයිපත්තු දකුණ, මන්මුනෙයි නිරිත හා පෝරතිවුපත්තු කොට්ඨාසවල දී ප්‍රතිචාර දක්වන්නන් පෙන්වා දුන්නේ තමන්ගේ ග්‍රාම නිලධාරි වසම තුළ කිසි ම පාසලක් නොපවතින බව සහ එම නිසා තමන්ගේ ග්‍රාම නිලධාරි වසමෙන් පිටත පිහිටි පාසල්වලට යාමට සිදු වූ බව යි.

එරාවූර් නගර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පාසල් සිසුන් තමන්ගේ ග්‍රාම නිලධාරි වසමෙන් පිටත පිහිටි පාසල්වලට යාමට තවත් හේතුවක් ලෙස අදාළ ගුරු මණ්ඩලයක් නොමැතිකම හඳුනා ගත හැකි විය. තම වසමෙන් පිටත පිහිටි පාසල්වලට යාම සම්බන්ධයෙන් ගත් කල තමන්ගේ දෙමව්පියන් ගිය පාසලවලට යාමට වැඩි කැමැත්තක් දැක්වීම සහ ස්ත්‍රී පුරුෂ භාවය අනුව වෙන් කරන ලද පාසල්වලට යාමට වැඩි කැමැත්තක් දැක්වීම එරාවූර් කොට්ඨාසයට සුවිශේෂී හේතු දෙකක් විය.

**2 රූප සටහන: තමන්ගේ ග්‍රාම නිලධාරි වසමෙන් පිටත පිහිටි පාසල්වලට යාමට හේතු**




## 2.2. ද්විතීය අධ්‍යාපන සේවාවන් ආශ්‍රිත ගුණාත්මක බව හා තෘප්තිය


**3 රූප සටහන** ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස හතරේ දෙමව්පියන් හා ද්විතීය පාසල් සිසුන් යන දෙපාර්ශ්වය ම විසින් ප්‍රකාශයට පත් කරන ලද තෘප්තියේ මට්ටම් පෙන්වා දෙයි. බහුතරයක් තමන්ට ලැබෙන අධ්‍යාපනයේ ගුණාත්මක බව සම්බන්ධයෙන් බෙහෙවින් තෘප්තිමත් හෝ තරමක් තෘප්තිමත් ය. 4, 5, 6 හා 7 රූප සටහන් ග්‍රාම නිලධාරි වසම අනුව තෘප්තියේ මට්ටම් දක්වයි. ග්‍රාම නිලධාරි වසම් බොහොමයක දී සිසුන්ගෙන් බහුතරයක් පෙන්වා දී ඇත්තේ තමන්ට ලැබෙන අධ්‍යාපනය සම්බන්ධයෙන් බෙහෙවින් තෘප්තිමත් හෝ තරමක් තෘප්තිමත් බව යි. කෙසේ වුව ද මීරාකර්නි, වාහනේරි, තිකිලිවඩ්ඩෙයි, කෝරකල්ලිමඩු, මුනෙයිකාඩු උතුර, සින්නවත්තෙයි හා සෙල්වපුරම් යන ග්‍රාම නිලධාරි වසම් තුළ අඩුවෙන් තෘප්තිමත් සිසුන් සැලකිය යුතු සංඛ්‍යාවක් සිටින බව පෙනී යයි. අඩුවෙන් තෘප්තිමත් වීමට හේතු ලෙස මේවා දක්වන ලදි:

- සමහර විෂයන් ඉගැන්වීම සඳහා අදාළ ගුරුවරුන් නොමැතිකම,
- ගුරුවරුන් නියමිත වේලාවට පාසලට නොපැමිණීම,
- අමතර පන්ති සඳහා අවස්ථා නොමැතිකම,
- අමතර පන්ති නොපැවැත්වීම,
- පන්ති පැවැත්වෙන්නේ 9 ශ්‍රේණිය දක්වා පමණක් වීම,
- අවශ්‍ය යටිතල පහසුකම් නොමැතිකම.


**3 රූප සටහන: අධ්‍යාපනයේ ගුණාත්මක බව පිළිබඳ සමස්ත තෘප්තිය**





**4 රූප සටහන: එරාවූර් කොට්ඨාසය තුළ අධ්‍යාපනයේ ගුණාත්මක බව පිළිබඳ තෘප්තිය**




**5 රූප සටහන: කෝරලෙයිපත්තු කොට්ඨාසය තුළ අධ්‍යාපනයේ ගුණාත්මක බව පිළිබඳ තෘප්තිය**




**6 රූප සටහන: මන්මුනෙයි නිරිත කොට්ඨාසය තුළ අධ්‍යාපනයේ ගුණාත්මක බව පිළිබඳ තෘප්තිය**





**7 රූප සටහන: පෝරතිවුපත්තු කොට්ඨාසය තුළ අධ්‍යාපනයේ ගුණාත්මක බව පිළිබඳ තෘප්තිය**





ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස හතරේ දී ම ශිෂ්‍යයන්ගෙන් 50%කට වැඩි ප්‍රතිශතයක් අමතර පන්තිවලට යන බවත් පෝරතිවුපත්තු හා මන්මුනෙයි නිරිත කොට්ඨාසවල දී ශිෂ්‍යයන්ගෙන් 70%ක් තරම් ප්‍රමාණයක් අමතර පන්තිවලට යන බවත් 8 රූප සටහනෙන් පෙනේ. මින් හැඟෙන්නේ සිසුන්ට අමතර පන්තිවලට යාමට සිදු වන්නේ එම කොට්ඨාසවල පිහිටි පාසල්වල දී තමන්ට ලැබෙන අධ්‍යාපනයේ ගුණාත්මක බව සම්බන්ධ අඩුපාඩුකම් නිසා බව විය හැකි ය.

**8 රූප සටහන: අමතර පන්තිවලට යන සිසුන්**





9, 10, 11 හා 12 රූප සටහන් අමතර පන්තිවලට යන සිසුන් ප්‍රමාණය ග්‍රාම නිලධාරී වසම් අනුව දක්වයි. සිසුන් විශාල ප්‍රමාණයක් අමතර පන්තිවලට යන ප්‍රදේශවල දී එසේ සිදු වන්නේ එම ග්‍රාම නිලධාරී වසම් තුළ පිහිටි පාසල්වල අධ්‍යාපනයේ ගුණාත්මක බව සම්බන්ධයෙන් පවත්නා ප්‍රශ්න නිසා බව හඳුනා ගත හැකි විය. අමතර පන්තිවලට යාමට හේතු වශයෙන් දක්වන ලද්දේ අමතර දැනුමක් ලබා ගැනීම සඳහා තමන්ට තිබෙන වුවමනාව, පාසල්වල දී විෂය නිර්දේශය ආවරණය නොකිරීම, පාසලේ දී උගන්වන දේවල් අවබෝධ කර ගැනීම ආශ්‍රිත දුෂ්කරතා, ගුරුවරුන් දරුවන්ගේ අධ්‍යාපනය කෙරෙහි ප්‍රමාණවත් අවධානයක් යොමු නොකිරීම සහ මිතුරන් අමතර පන්තිවලට යන නිසා තමන්ට ද යාමට සිදු වීම යි.


**9 රූප සටහන: එරාවූර් නගර කොට්ඨාසය තුළ අමතර පන්තිවලට යන සිසුන්**





**10 රූප සටහන: කෝරලෙයිපත්තු කොට්ඨාසය තුළ අමතර පන්තිවලට යන සිසුන්**



**11 රූප සටහන: මන්මුනෙයි නිරිත කොට්ඨාසය තුළ අමතර පන්තිවලට යන සිසුන්**




**12 රූප සටහන: පෝරතිවුපත්තු නිරිත කොට්ඨාසය තුළ අමතර පන්තිවලට යන සිසුන්**




## 2.3. පහසුකම්

**13 රූප සටහන** ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස හතර තුළම ද්විතීය පාසල් සිසුන් සඳහා පවත්නා පහසුකම් පිළිබඳ සාරාංශයක් ඉදිරිපත් කරයි. මෙම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස හතර තුළ මුළුතැන් ගෙවල් පහසුකම්, දිවා ආහාර සහ "සුරක්ෂා" රක්ෂණ ක්‍රමය වැනි පහසුකම් පවතින්නේ අඩුවෙනි. ශ්‍රී ලංකාවේ සියලු සිසුන්ට සම්බන්ධ විය හැකි

"සුරක්ෂා" සිසු රක්ෂණ යෝජනා ක්‍රමය සම්බන්ධයෙන් ගත් කල, ප්‍රතිචාර දැක්වූවන්ගෙන් සමහරෙකු තමන්ට එම රක්ෂණය ලබා ගත නොහැකි බව පවසා ඇත්තේ ඔවුන් මෙම පහසුකම ගැන නිසි දැනුමක් නොමැතිකම නිසා බව වාර්තා විය. එම නිසා මින් පෙනෙන්නේ තමන්ට හිමි ප්‍රතිලාභ ලබා ගැනීමට හැකි වන පරිදි සියලු සිසුන්, විශේෂයෙන් ම මෙම රක්ෂණයෙන් වඩාත් ම ප්‍රතිලාභ ලැබිය හැකි ප්‍රමාණවත් සේවා සම්පාදනයක් සිදු නොවන ප්‍රදේශවල සිසුන් මෙම පහසුකම ලබා ගත හැකි ආකාරය ගැන දැනුවත් කිරීමේ අවශ්‍යතාවක් පවතින බව යි. දිවා ආහාරය සලකන කල ප්‍රාථමික පාසල් සිසුන්ට හෝ සිසුන් 100ට වඩා අඩු සංඛ්‍යාවක් සිටින පාසල්වලට දිවා ආහාරය ලබා දීමේ අවශ්‍යතාවක් පවතී. ද්විතීය පාසල් සිසුන්ට මෙම පහසුකම ලබා දීම අනිවාර්ය නොවන අතර සමීක්ෂණයට ලක් කරන ලද ප්‍රදේශවල මෙම පහසුකම නොපවත්නා බව මෙම සමීක්ෂණයෙන් පිළිබිඹු වීමට හේතුව එය වේ. කෙසේ වුව ද ප්‍රාථමික පාසල්වල ඉගෙන ගන්නා තමන්ගේ බාල සොහොයුරු සොහොයුරියන්ට දිවා ආහාරය ලැබෙන බැවින් තමන්ට ද දිවා ආහාරය ලැබිය යුතු යැයි ද්විතීය පාසල් සිසුන් අතර අපේක්ෂාවක් පවතින බව පෙනී යයි.

පාසල් සිසුන්ගෙන් 100%කට ම පාහේ නිල ඇඳුම් වවුචර ලැබෙන බව ද සඳහන් කෙරුණු අතර කලින් මෙන් නිල ඇඳුම් සඳහා රෙදි නොව වවුචර ලබා ගැනීමට වැඩි කැමැත්තක් දක්වනු ලැබිණ. සමහර ළමයි සපත්තු හෝ වෙනත් ඇඳුම් පැලඳුම් වැනි වෙනත් අවශ්‍යතා මිල දී ගැනීමට වවුචර යොදා ගන්නා බව වාර්තා විය. නිල ඇඳුම් වවුචර නිසා සිදු වන අවාසිය වන්නේ වවුචරවලින් නිල ඇඳුම්/ද්‍රව්‍ය මිල දී ගැනීම සඳහා සැලකිය යුතු දුරක පිහිටි වාණිජ මධ්‍යස්ථානයකට යාමට සිදු වන ඉතා දුර බැහැර ප්‍රදේශවල සිසුන්ට ඉන් අපහසුතාවක් ඇති වීම යි.


**13 රූප සටහන: පහසුකම් පැවතීම හා භාවිතය**





## 2.4. අමතර ගෙවීම්

තමන්ගේ පාසල්වලට විවිධ ගෙවීම් කිරීමට සිදු වී ඇති නිසා සමහර සිසුන් අමතර වියදම් දරා ඇති බව ද විද්‍යුත් පුරවැසි වාර්තාපත් සමීක්ෂණයෙන් අනාවරණය විය. බොහෝ අවස්ථාවල දී මෙම ගෙවීම් මුදලින් කරන ලෙස ඉල්ලා සිටි නමුත් එම ගෙවීම් භාණ්ඩ හෝ සේවා ස්වරූපයෙන් ගෙවන ලෙස ඉල්ලා සිටින ලදැයි සිසුන් ඉතා සුළු ප්‍රමාණයක් පවසා ඇති බව **14 රූප සටහන** පෙන්වා දෙයි. බොහෝ අවස්ථාවල දී මෙම ගෙවීම් සඳහා සිසුන්ට ලදු පත් නිකුත් කෙරුණු නමුත් සැලකිය යුතු සිසුන් සංඛ්‍යාවක් තමන්ට ලදු පතක් නිකුත් නොකෙරුණු බව පවසා ඇති බව ද **15 රූප සටහන** පෙන්වා දෙයි. මෙවැනි ගනුදෙනුවල නීත්‍යනුකූලත්වය සොයා බැලීමට ඒවා පිළිබඳව විමර්ශනයක් සිදු කිරීම සුදුසු විය හැකි ය.

14 රූප සටහන: පාසල් විසින් ඉල්ලා සිටිනු ලබන අමතර ගෙවීම්





15 රූප සටහන: පාසල්වලට කරන අමතර ගෙවීම් සඳහා ලදු පත් නිකුත් කිරීම




## 2.5. වෙනත් අපහසුතා


සමීක්ෂණයට ලක් කෙරුණු පාසල් සිසුන්ගෙන් සමහරෙකු පැවසුවේ තමන් තම පාසල්වල දී දඬුවම් පැමිණවීම ආශ්‍රිත ගැටලුවලට මුහුණ පා ඇති බව යි. **16 රූප සටහන** මේ බව පෙන්වා දෙයි.

**16 රූප සටහන: පාසල් තුළ පවත්නා දඬුවම් පැමිණවීම ආශ්‍රිත ගැටලු**





පාසල්වල දී ශාරීරික දඬුවම් පැමිණවීම ශ්‍රී ලංකාව තුළ තහනම් කරනු ලැබ ඇති නමුත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස හතරේ දී ම සිසුන්ට වඩාත් ම නිරතුරුව දඬුවම් කරන්නේ වේවැලෙන් පහර දීමෙන් බව සමීක්ෂණයෙන් අනාවරණය වී තිබීම බෙහෙවින් කනස්සල්ල දනවයි. 17 **රූප සටහන** මෙම තත්ත්වය පෙන්වා දෙයි.

**17 රූප සටහන: සිසුන්ට ලබා දෙන දඬුවම් වර්ග**





**16 රූප සටහන සහ 17 රූප සටහන** පෙන්වා දෙන්නේ පාසල් තුළ දී අසමාන ලෙස සැලකීම් හා අපයෝජන (කායික, මානසික, වාචික) සිදු වී ඇති අවස්ථා ද සිසුන් විසින් වාර්තා කෙරුණු බව යි. සිදුවීම් ඉතා සුළු සංඛ්‍යාවක් වාර්තා වී ඇති නමුත් අපයෝජනය හා අසමාන ලෙස සැලකීම යනු මානව හිමිකම් උල්ලංඝනය කිරීමක් විය හැකි බැවින් බලධාරීන් මෙම සිදුවීම් පිළිබඳව අවධානය යොමු කිරීම සුදුසු විය හැකි ය.

**18 රූප සටහන: පාසල් තුළ දී අසමාන ලෙස සැලකීම් සිදු වී ඇති අවස්ථා**





**19 රූප සටහන: පාසල් තුළ දී අපයෝජන සිදු වී ඇති අවස්ථා**




සිසුන් සහ දෙමව්පියන් ගුරුවරුන් සම්බන්ධ විවිධ ගැටලු ද වාර්තා කළ අතර (**20 රූප සටහන** බලන්න) ඒවා අධ්‍යාපන සේවා සම්පාදනයේ ගුණාත්මක බව කෙරෙහි බලපෑ හැකිය. ගුරුවරුන් සම්බන්ධ ගැටලු වැඩි වශයෙන් ම තිබෙන්නේ එරාවූර් නගර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ බව පෙනේ.

**20 රූප සටහන: ගුරුවරුන් සම්බන්ධ ගැටලු**



# 3. ද්විතීය අධ්‍යාපන සේවාවන් සඳහා ලබා දුන් සමස්ත ලකුණු ප්‍රමාණය

මඩකලපුව දිස්ත්‍රික්කයේ අධ්‍යයන ප්‍රදේශය තුළ ද්විතීය අධ්‍යාපන සේවා සම්පාදනයේ කාර්ය සාධනය සඳහා ලබා දුන් ලකුණු ප්‍රමාණය 21 **රූප සටහනේ** දැක්වේ. අධ්‍යයන ප්‍රදේශය තුළ පිහිටි සෑම ග්‍රාම නිලධාරි වසමක ම ද්විතීය අධ්‍යාපන සේවාවන් සඳහා ලකුණු දී ඇත. ලකුණු දී ඇත්තේ ද්විතීය අධ්‍යාපන සේවාවන් පිළිබඳව බෙහෙවින් තෘප්තිමත් පරිහරණය කරන්නන්ගේ ප්‍රතිශත පදනම් කර ගෙන ය.

| **වර්ණය** | **බෙහෙවින් තෘප්තිමත් පරිහරණය කරන්නන්ගේ %** | **ගත යුතු පියවර** |
|---|---|---|
| රතු | බෙහෙවින් තෘප්තිමත් පරිහරණය කරන්නන් 40%ට වඩා අඩු | වහා ම අවධානය යොමු කළ යුතු ය |
| කහ | බෙහෙවින් තෘප්තිමත් පරිහරණය කරන්නන් 40%-60% අතර | වැඩි දියුණු කළ යුතු ය |
| කොළ | බෙහෙවින් තෘප්තිමත් පරිහරණය කරන්නන් 60%ට වඩා වැඩි | කාර්ය සාධනය අඛණ්ඩව පවත්වා ගෙන යා යුතු අතර වැඩි දියුණු කිරීම් අඛණ්ඩව කර ගෙන යා හැකි නම් වඩාත් හොඳ ය |

අධ්‍යයන ප්‍රදේශයේ සෑම ග්‍රාම නිලධාරි වසමක ම ද්විතීය අධ්‍යාපන සේවා සම්පාදනය සම්බන්ධයෙන් වහා ම අවධානය යොමු කළ යුතු අංශ ගණනාවක් පවතී. මේවා 21 **රූප සටහනේ** දක්වා ඇත.

**21 රූප සටහන: ද්විතීය අධ්‍යාපන සේවා සම්පාදනය පිළිබඳ සමස්ත ශ්‍රේණිගත කිරීම්**

| | පානීය ජලය | වැසිකිළි | පුස්තකාල | විද්‍යාගාරය | දිවා ආහාරය | පෙළ පොත් | පරිඝණක විද්‍යාගාර | ගුරුවරු | කුස්සිය | සුරක්ෂා රක්ෂණය | නිල ඇඳුම් වවුචර් | ආපන ශාලාව | ක්‍රීඩාපිටිය | වැට/ තාප්පය |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| අයියන්කර්නි මුස්ලිම් | 100% | 79% | 58% | 60% | 100% | 36% | 62% | 75% | 64% | 0% | 25% | 56% | 33% | 71% |
| මිචිනගර් | 88% | 69% | 58% | 54% | 54% | 60% | 47% | 70% | 52% | 25% | 46% | 53% | 53% | 72% |
| මීරාකර්නි | 70% | 69% | 40% | 26% | 50% | 54% | 51% | 60% | 27% | 24% | 39% | 50% | 28% | 15% |
| දේවපුරම් | 67% | 48% | 60% | 60% | 50% | 48% | 15% | 62% | 11% | 57% | 33% | 37% | 21% | 27% |
| මහිලඩිතිවූ දකුණ | 63% | 65% | 41% | 38% | 50% | 47% | 29% | 69% | 41% | 0% | 59% | 27% | 70% | 59% |
| කිරාන් නැගෙනහිර | 59% | 36% | 52% | 46% | 21% | 56% | 35% | 36% | 25% | 22% | 40% | 18% | 21% | 65% |
| අරසඩිතිවූ උතුර | 55% | 64% | 50% | 45% | 0% | 22% | 40% | 80% | 25% | 0% | 55% | 64% | 75% | 64% |
| කෝරකල්ලිමඩු | 52% | 25% | 26% | 13% | 25% | 25% | 17% | 43% | 0% | 17% | 54% | 8% | 9% | 24% |
| කනේසපුරම් | 50% | 23% | 0% | 0% | 0% | 20% | 0% | 69% | 18% | 71% | 77% | 10% | 0% | 17% |
| වාහනේරි | 47% | 20% | 0% | 0% | 33% | 20% | 8% | 47% | 8% | 0% | 80% | 20% | 0% | 0% |
| කෝවිල් පෝරතිවූ බටහිර | 40% | 46% | 58% | 58% | 83% | 85% | 62% | 69% | 67% | 25% | 77% | 25% | 100% | 92% |
| මුනෙයිකාඩු බටහිර | 40% | 36% | 60% | 50% | 0% | 20% | 27% | 55% | 0% | 33% | 36% | 27% | 29% | 27% |
| කොක්කඩිචෝලෙයි | 39% | 24% | 6% | 21% | 57% | 50% | 0% | 56% | 24% | 0% | 44% | 44% | 22% | 22% |
| සින්නවත්තෙයි | 38% | 8% | 11% | 11% | 20% | 31% | 8% | 8% | 11% | 0% | 23% | 14% | 0% | 0% |
| සෙල්වපුරම් | 36% | 30% | 0% | 0% | 80% | 50% | 0% | 42% | 38% | 0% | 25% | 0% | 0% | 0% |
| මාවෙට්කුඩා | 33% | 38% | 31% | 31% | 0% | 69% | 17% | 46% | 0% | 0% | 38% | 23% | 31% | 46% |
| තිකිලිවෙට්ටෙයි | 33% | 11% | 20% | 22% | 25% | 55% | 30% | 9% | 25% | 0% | 36% | 20% | 10% | 17% |
| කඩුක්කමුනෙයි | 29% | 13% | 38% | 31% | 0% | 43% | 18% | 53% | 50% | 27% | 53% | 33% | 10% | 7% |
| මුනෙයිකාඩු උතුර | 27% | 31% | 31% | 8% | 0% | 17% | 33% | 38% | 0% | 60% | 62% | 15% | 0% | 0% |
| වන්නිනගර් | 25% | 42% | 67% | 42% | 0% | 92% | 33% | 82% | 50% | 33% | 92% | 0% | 17% | 58% |

(රතු) බෙහෙවින් තෘප්තිමත් ප්‍රතිචාර දක්වන්නන් 40%ට වඩා අඩු

(කහ) බෙහෙවින් තෘප්තිමත් ප්‍රතිචාර දක්වන්නන් 40%-60% අතර

(කොළ) බෙහෙවින් තෘප්තිමත් ප්‍රතිචාර දක්වන්නන් 60%ට වඩා වැඩි

# 4. නිර්දේශ


## 4.1. වැඩි දියුණු කළ යුතු සේවා අංශ

### 4.1.1 වහාම පියවර ගතයුතු අංශ


විද්‍යුත් පුරවැසි වාර්තාපත් සමීක්ෂණයේ ප්‍රතිඵල ප්‍රතිචාර දක්වන්නන් විසින් වහා ම අවධානය යොමු කළ යුතු බවට හඳුනා ගැනුණු අංශ ගණනාවක් අනාවරණය කරයි (**22 රූප සටහන** බලන්න). සමස්තයක් ලෙස ගත් විට හඳුනා ගෙන ඇති ප්‍රමුඛතා අංශ තුන වන්නේ ජල සම්පාදනය, ක්‍රීඩාංගණ හා සනීපාරක්ෂක පහසුකම් ය.

**23, 24, 25** හා **26** රූප සටහන් ඒ ඒ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ දී වහා ම අවධානය යොමු කළ යුතු අංශ පෙන්වා දෙයි. ජල සම්පාදනය, ක්‍රීඩාංගණ හා සනීපාරක්ෂක පහසුකම් යන ප්‍රමුඛතා අංශ තුන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස හතරේ දී ම දක්නට ලැබේ. කඩිනමින් පියවර ගැනීම සඳහා මෙම ප්‍රමුඛතා අංශ සලකා බැලිය යුතු යැයි නිර්දේශ කරනු ලැබේ.


**22 රූප සටහන: වහා ම පියවර ගත යුතු අංශ**




**23 රූප සටහන: එරාවූර් නගර කොට්ඨාසය තුළ පවත්නා වහා ම පියවර ගත යුතු අංශ**





**24 රූප සටහන: කෝරළෙයිපත්තු කොට්ඨාසය තුළ පවත්නා වහා ම පියවර ගත යුතු අංශ**



**25 රූප සටහන: මන්මුනෙයි නිරිත කොට්ඨාසය තුළ පවත්නා වහා ම පියවර ගත යුතු අංශ**




**26 රූප සටහන: පෝරතිවුපත්තු කොට්ඨාසය තුළ පවත්නා වහා ම පියවර ගත යුතු අංශ**




ප්‍රතිචාර දක්වන්නන් ද්විතීය අධ්‍යාපන සේවා සම්පාදනය සම්බන්ධයෙන් පොදුවේ අතෘප්තිමත් බව පළ කළ තැන්වල දී ඔවුහු එම අතෘප්තියට හේතු වශයෙන් කරුණු ගණනාවක් හඳුනා ගත්හ. පාසල් තුළ අවශ්‍ය පහසුකම් නොමැතිකම, පහසුකම් නඩත්තු නොකිරීම, පැමිණිලිවලට විසඳුම් ලබා දීමේ දී රජයේ නිලධාරීන් සුළු වශයෙන් ප්‍රතිචාර දැක්වීම සහ අවශ්‍ය පියවර ගැනීම සඳහා දේශපාලනික උනන්දුවක් නැතිකම යනාදිය ඒ අතර විය. ද්විතීය අධ්‍යාපන සේවා සම්පාදනය වැඩි දියුණු කිරීම සඳහා ප්‍රතිචාර දක්වන්නන් විසින් ඉදිරිපත් කෙරුණු යෝජනාවලින් අවධාරණය වූයේ ද්විතීය අධ්‍යාපන සේවාවන් ආශ්‍රිත ගැටලුවලට විසඳුම් ලබා දීමේ දී දේශපාලන නායකත්වය හා රජයේ නිලධාරීන් වඩාත් ක්‍රියාකාරීව සහභාගි විය යුතු බව යි.

### 4.1.2. වෙනත් සලකා බැලීම්

ද්විතීය අධ්‍යාපන අංශය තුළ ප්‍රතිසංස්කරණ හා වැඩි දියුණු කිරීම් සැලසුම් කිරීම සඳහා සුදුසු අවම මට්ටමක් (විශේෂයෙන් ම **21 රූප සටහන** තුළ දක්වා ඇති ලකුණු ප්‍රමාණය) සම්පාදනය කිරීමට මෙම අධ්‍යයනයේ දත්තවලට හැකියාව ඇත.

අංශය තුළ අනාගත සැලසුම් හා අය වැය සකස් කිරීමේ ක්‍රියාකාරකම්වල දී ඉහත සඳහන් වහා ම අවධානය යොමු කළ යුතු ප්‍රමුඛතාවන් ද වැඩි දියුණු කළ යුතු/අවධානය යොමු කළ යුතු බවට හඳුනා ගෙන ඇති අංශ ද සැලකිල්ලට ගත යුතු ය.

ග්‍රාම නිලධාරි වසම් අතර සේවා සම්පාදනයේ පුළුල් විවිධත්වයක් පවතින අතර, දිස්ත්‍රික්කය තුළ පවත්නා ග්‍රාම නිලධාරි වසම්වල ද්විතීය අධ්‍යාපන සේවා සම්පාදනයේ අසමානතාවක් දක්නට ලැබෙන්නේ කෙසේ ද හා ඒ කුමන හේතු නිසා ද යන්න සහ ඵලදායක ලෙස ඒවාට විසඳුම් සැපයිය හැක්කේ කෙසේ ද යන්න අවබෝධ කර ගැනීම සඳහා මෙම දත්ත වඩාත් සමීපව විමසා බැලීම උචිත වේ.

## 4.2. ඉදිරි මාවත

ක්‍රියාකාරී සැලසුම් සකස් කර ඇත්තේ විද්‍යුත් පුරවැසි වාර්තාපත් සමීක්ෂණයේ මූලික සොයා ගැනීම් පදනම් කර ගනිමිනි. පළාත් පාලන ආයතනවල ජ්‍යෙෂ්ඨ නිලධාරීන්, ප්‍රාදේශීය සභා ලේකම්වරුන්, කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්, නියෝජ්‍ය අධ්‍යක්ෂවරුන් හා ප්‍රජා නියෝජිතයන් වෙත එම සොයා ගැනීම් ඉදිරිපත් කරනු ලැබිණ. විද්‍යුත් පුරවැසි වාර්තාපතෙහි දෙවන වටය දියත් වීමට පෙර සේවාවන් වැඩි දියුණු කිරීම සඳහා කෙටි කාලීන හා දීර්ඝ කාලීන අරමුණු හඳුනා ගනිමින් ක්‍රියාකාරී සැලසුම් සකස් කිරීම පිණිස සේවා සම්පාදකයන් සහ සේවාලාභීන් අතර සාකච්ඡාවලට පහසුකම් සපයනු ලැබිණ. මඩකලපුව දිස්ත්‍රික්කයේ ද්විතීය අධ්‍යාපන සේවා සම්පාදනයට අදාළ ක්‍රියාකාරී සැලසුම් 1 ඇමුණුමේ දක්වා ඇත.

දෙවන විද්‍යුත් පුරවැසි වාර්තාපත් සමීක්ෂණය 2018 ඔක්තෝබර් මාසයේ පැවැත්වීමට සැලසුම් කර ඇත. එම සමීක්ෂණය සේවා සම්පාදනය සම්බන්ධයෙන් **21 රූප සටහනේ** දක්වා ඇති ශ්‍රේණිගත කිරීම් සමග සසඳා බලමින් ප්‍රගතිය සොයා බැලීමට හැකියාව ලබා දෙනු ඇත. ක්‍රියාකාරී සැලැස්මේ දී හඳුනා ගෙන ඇති කෙටි කාලීන පියවරයන් සම්බන්ධයෙන් ප්‍රගතියක් අත් කර ගනු ඇතැයි අපේක්ෂා කෙරේ. සේවා සම්පාදනය සම්බන්ධ තෘප්තියේ වැඩි දියුණුවක් සිදු වී ඇත් නම් ශ්‍රේණිගත කිරීම් ප්‍රස්තාරයේ (**21 රූප සටහන**) වර්ණවල සිදු වී ඇති වෙනස්කම් මගින් තෘප්තිමත් බව පිළිබඳ පහත දැක්වෙන ශ්‍රේණිගත කිරීම් පිළිබිඹු වනු ඇතැයි අපේක්ෂා කළ හැකි වේ. වර්ණ වෙනස්කම් පැහැදිලිව දක්නට නැතත් තෘප්තියේ ප්‍රතිශතය වැඩි වී ඇත් නම් සේවා සම්පාදනය සම්බන්ධයෙන් ප්‍රගතියක් අත් කර ගෙන ඇතැයි සැලකිය හැකි වේ.

| වර්ණය | බෙහෙවින් තෘප්තිමත් පරිහරණය කරන්නන්ගේ % | ගත යුතු පියවර |
|---|---|---|
| රතු | බෙහෙවින් තෘප්තිමත් පරිහරණය කරන්නන් 40%ට වඩා අඩු | වහා ම අවධානය යොමු කළ යුතු ය |
| කහ | බෙහෙවින් තෘප්තිමත් පරිහරණය කරන්නන් 40%-60% අතර | වැඩි දියුණු කළ යුතු ය |
| කොළ | බෙහෙවින් තෘප්තිමත් පරිහරණය කරන්නන් 60%ට වඩා වැඩි | කාර්ය සාධනය අඛණ්ඩව පවත්වා ගෙන යා යුතු අතර වැඩි දියුණු කිරීම් අඛණ්ඩව කර ගෙන යා හැකි නම් වඩාත් හොඳ ය |

සේවා සම්පාදකයන් සේවා සම්පාදනය වැඩි දියුණු කිරීම සඳහා ක්‍රියාකාරී සැලසුම්වල දී හඳුනා ගෙන ඇති පියවරයන් ක්‍රියාවට නැංවිය යුතු අතර ප්‍රජාව විසින් ක්‍රියාකාරකම්වල ප්‍රගතිය සම්බන්ධයෙන් සේවා සම්පාදකයන් පිළිබඳව සමීප පසු විපරමක යෙදෙමින් 21 රූප සටහනේ දැක්වෙන ශ්‍රේණිගත කිරීම් සමග සසඳමින් ප්‍රගතිය සොයා බැලිය යුතු ය.

විද්‍යුත් පුරවැසි වාර්තාපතේ සොයා ගැනීම් ප්‍රජා ප්‍රතිපෝෂණ පදනම් කර ගත් දර්ශක නොහොත් මාර්ගෝපදේශ බවත් ද්විතීය අධ්‍යාපන සේවා සම්පාදනය පිළිබඳ වඩාත් සංකීර්ණ පාදක ගැටලු පැවතිය හැකි තැන් ඒවා මගින් පෙන්නුම් කෙරෙන බවත් සිත තබා ගනිමින් ගැටලු පවත්නා අංශ තව දුරටත් විමර්ශනය කිරීම සඳහා මෙම විද්‍යුත් පුරවැසි වාර්තාපතෙන් සම්පාදනය වන තොරතුරු යොදා ගත හැකි ය. මෙම ගැටලුවලට පදනම් වන හේතු අවබෝධ කර ගැනීම සඳහා වඩාත් ගැඹුරු විමසා බැලීමක් හා අධ්‍යයනයක් අවශ්‍ය විය හැකි ය.

ඉලක්ක පියවරයන්ට මුල පිරීම පිණිස පහත දැක්වෙන පියවරයන් නිර්දේශ කළ හැකි ය:

- විද්‍යුත් පුරවැසි වාර්තාපතේ ශ්‍රේණිගත කිරීම් පදනම් කර ගෙන සේවා කාර්ය සාධනයේ විශේෂ දුර්වලතාවක් පෙන්නුම් කරන අංශ හඳුනා ගන්න,

- සේවාවන් වැඩි දියුණු කිරීම සඳහා සැපිරීමට සිදු විය හැකි අඩුපාඩුකම් හඳුනා ගනිමින් ඵලදායක අධ්‍යාපන සේවා සම්පාදනයට බාධා කරන පාදක හේතු හා සාධක කවරේ දැයි විමසා බලන්න,

- අධ්‍යාපන සේවා සම්පාදනයේ අඩුපාඩුකම් මග හැරවීම සඳහා එක වර මැදිහත් වීම් ගණනාවක් කිරීමට සිදු විය හැකි ය,

- සේවා සම්පාදනයේ අඩුපාඩුකම් මග හැරවූ පසු සේවාවන් පරිහරණය කරන්නන්ගේ තෘප්තියේ මට්ටම් පිළිබඳව පසු විපරමක යෙදීම සේවා කාර්ය සාධනය අවම මට්ටම්වලින් ඉහළට වැඩි දියුණු වී ඇත් දැයි තීරණය කිරීම සඳහා ප්‍රයෝජනවත් විය හැකි ය.

# ඇමුණුම 1: ක්‍රියාකාරී වැඩ සැලැස්ම

**විද්‍යුත් පුරවැසි වාර්තාපතේ සොයා ගැනීම් පදනම් කර ගෙන පාසල් තුළ අධ්‍යාපනය පිළිබඳ තෘප්තිය වැඩි දියුණු කිරීම සඳහා**

**ක්‍රියාකාරී සැලැස්ම - මඩකලපුව මධ්‍යම කලාප අධ්‍යාපන කාර්යාලය**

| අනුක්‍රමික අංකය | සේවාවල ප්‍රමුඛතාව (කුමන සේවාවන් ද) | දීර්ඝ කාලීන හෝ කෙටි කාලීන | වගකිව යුත්තේ කවුරුන් ද | වෙනත් පාර්ශ්වකරුවන්/අවශ්‍ය සම්පත් | ආරම්භ කරන දිනය | අවසන් කරන දිනය | පසු විපරමේ යෙදෙන්නේ කවුරුන් ද |
|---|---|---|---|---|---|---|---|
| 1 | සුරක්ෂා රක්ෂණය | කෙටි කාලීන | විදුහල්පති | ගුරුවරුන්, පාසල් සංවර්ධන සමිතිය | 2018 මැයි 07 | 2018 අගෝස්තු 04 | කොට්ඨාශ අධ්‍යාපන කාර්යාලය, කළමනාකාරිත්වය |
| 2 | පෙළ පොත් | කෙටි කාලීන | විදුහල්පති | පන්ති භාර ගුරුවරයා | 2018 මැයි 07 | 2018 ජුලි 07 | කොට්ඨාශ අධ්‍යාපන කාර්යාලය, එරාවූර් |
| 3 | නිල ඇඳුම් | කෙටි කාලීන | විදුහල්පති | පන්ති භාර ගුරුවරයා | 2018 මැයි 07 | 2018 ජුලි 07 | කොට්ඨාශ අධ්‍යාපන කාර්යාලය, කළමනාකාරිත්වය |
| 4 | පුස්තකාලය | කෙටි කාලීන | විදුහල්පති | පුස්තකාලය භාර ගුරුවරයා, විෂය භාර ගුරුවරයා | 2018 මැයි 07 | 2018 අගෝස්තු 04 | කොට්ඨාශ අධ්‍යාපන කාර්යාලය, කළමනාකාරිත්වය |
| 5 | ක්‍රීඩාංගණය | දීර්ඝ කාලීන | විදුහල්පති | දේශපාලනඥයා, පාසල් සංවර්ධන සමිතිය, ක්‍රීඩා උපකරණ | 2018 මැයි 07 | 2020 මැයි 06 | පාසල් සංවර්ධන සමිතිය |
| 6 | මායිම් තාප්පය | දීර්ඝ කාලීන | විදුහල්පති | දේශපාලනඥයා, පාසල් සංවර්ධන සමිතිය | 2018 මැයි 07 | 2019 මැයි 06 | මීටල අතිරේක අධ්‍යාපන අධ්‍යක්ෂක, ශාරීරික අධ්‍යාපනය උපදේශක |
| 7 | විද්‍යාගාරය | දීර්ඝ කාලීන | විදුහල්පති | දේශපාලනඥයා, පාසල් සංවර්ධන සමිතියල විද්‍යා ගුරුවරයා, විද්‍යාගාර සහායක | 2018 මැයි 07 | 2018 දෙසැම්බර් 06 | කොට්ඨාශ අධ්‍යාපන කාර්යාලය, විද්‍යා ගුරු උපදේශක, සේවාස්ථ උපදේශක |
| 8 | ආපන ශාලාව | දීර්ඝ කාලීන | විදුහල්පති | ගුරුවරුන්, පාසල් සංවර්ධන සමිතියල මහජන සෞඛ්‍ය පරීක්ෂකල | 2018 මැයි 07 | 2018 මැයි 06 | කොට්ඨාශ අධ්‍යාපන කාර්යාලය, කළමනාකාරිත්වය |

**විද්‍යුත් පුරවැසි වාර්තාපතේ සොයා ගැනීම් පදනම් කර ගෙන පාසල් තුළ අධ්‍යාපනය පිළිබඳ තෘප්තිය වැඩි දියුණු කිරීම සඳහා ක්‍රියාකාරී සැලැස්ම**

**- පත්තිරුප්පු කලාප අධ්‍යාපන කාර්යාලය**

| | සේවාවල ප්‍රමුඛතාව (කුමන සේවාවන් ද) | දීර්ඝ කාලීන හෝ කෙටි කාලීන | වගකිව යුත්තේ කවුරුන් ද | වෙනත් පාර්ශ්වකරුවන්/ අවශ්‍ය සම්පත් | ආරම්භ කරන දිනය | අවසන් කරන දිනය | පසු විපරමේ යෙදෙන්නේ කවුරුන් ද |
|---|---|---|---|---|---|---|---|
| 1 | සුරක්ෂා රක්ෂණය පිළිබඳව පැහැදිලි හා පුළුල් දැනුවත්කමක් ඇති කිරීම | කෙටි කාලීන | පාසලේ විදුහල්පති | පාසල් සංවර්ධන සමිතියල ආදි සිසුන් | 2018 මැයි 18 | 2018 සැප්තැම්බර් | කලාප අධ්‍යාපන කාර්යාලය |
| 2 | ආපන ශාලාව | කෙටි කාලීන | පාසලේ විදුහල්පති | පාසල් සංවර්ධන සමිතියල ආදි සිසුන් | 2018 මැයි 18 | 2018 සැප්තැම්බර් | කලාප අධ්‍යාපන කාර්යාලය |
| 3 | දිවා ආහාර | කෙටි කාලීන | පාසලේ විදුහල්පති | පාසල් සංවර්ධන සමිතියල ආදි සිසුන් | 2018 මැයි 18 | 2018 සැප්තැම්බර් | කලාප අධ්‍යාපන කාර්යාලය |
| 4 | පෙළ පොත් | කෙටි කාලීන | පාසලේ විදුහල්පති | කොට්ඨාස අධ්‍යාපන අධ්‍යක්ෂ | 2018 මැයි 18 | 2018 සැප්තැම්බර් | කලාප අධ්‍යාපන කාර්යාලය |
| 5 | පානීය ජලය | දීර්ඝ කාලීන | පාසලේ විදුහල්පති | පාසල් සංවර්ධන සමිතියල ආදි සිසුන් | 2018 ජුනි 18 | 2018 දෙසැම්බර් | කලාප අධ්‍යාපන කාර්යාලය |
| 6 | සනීපාරක්ෂාව | දීර්ඝ කාලීන | පාසලේ විදුහල්පති | පාසල් සංවර්ධන සමිතියල ආදි සිසුන් | 2018 ජුනි 18 | 2019 ජුනි | කලාප අධ්‍යාපන කාර්යාලය |
| 7 | ගුරු හිඟය | දීර්ඝ කාලීන | පාසලේ විදුහල්පති | කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ | 2018 ජුනි 18 | 2019 ජුනි | කලාප අධ්‍යාපන කාර්යාලය |
| 8 | පුස්තකාලය | දීර්ඝ කාලීන | පාසලේ විදුහල්පති | පාසල් සංවර්ධන සමිතියල ආදි සිසුන් | 2018 ජුනි 18 | 2019 ජුනි | කලාප අධ්‍යාපන කාර්යාලය |

**විද්‍යුත් පුරවැසි වාර්තාපතේ සොයා ගැනීම් පදනම් කර ගෙන පාසල් තුළ අධ්‍යාපනය පිළිබඳ තාප්තිය වැඩි දියුණු කිරීම සඳහා ක්‍රියාකාරී සැලැස්ම - මඩකලපුව බටහිර අධ්‍යාපන කලාපය**

| අනුක්‍රමික අංකය | සේවාවන්හි ප්‍රමුඛතාව (කුමන සේවාවන් ද) | දීර්ඝ කාලීන හෝ කෙටි කාලීන | වගකිව යුත්තේ කවුරුන් ද | වෙනත් පාර්ශ්වකරුවන් / අවශ්‍ය සම්පත් | ආරම්භ කරන දිනය | අවසන් කරන දිනය | පසු විපරමේ යෙදෙන්නේ කවුරුන් ද |
|---|---|---|---|---|---|---|---|
| 1 | **පානීය ජල පහසුකම්** | | විදුහල්පති | මන්මුනෙයි නිරිත ප්‍රාදේශීය සභාව | 2018 මැයි | 2018 මැයි | පාසල් සංවර්ධන කමිටුව |
| | I. කඩුක්කමුනෙයි වානි විද්‍යාලයට සහ කොක්කඩිචෝලෙයි අයි.කේ. මහා විද්‍යාලයට අඛණ්ඩව හා නිතිපතා ප්‍රාදේශීය සබාවෙන් ජලය සැපයෙන බව සහතික කිරීම | කෙටි කාලීන | | | | | |
| | II. මෙම කලාපය තුළ පිහිටි පාසල් 21ක ජලයේ ගුණාත්මක බව පිළිබඳව දැනුවත්කම ඇති කිරීම හා පැහැදිලි කිරීම | කෙටි කාලීන | විදුහල්පති | මහජන සෞඛ්‍ය පරීක්ෂක | 2018 මැයි | 2018 ජූනි | පාසල් සංවර්ධන කමිටුව |
| 2 | **සුරක්ෂා සිසු රක්ෂණය** | | විදුහල්පති | නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ සැලසුම්කරණ | 2018 මැයි | 2018 ජූනි | පාසල් මට්ටමේ දී සුරක්ෂා රක්ෂණය භාර පුද්ගලයා |
| | පාසල් මට්ටමේ දී සුරක්ෂා රක්ෂණය පිළිබඳව දැනුවත් කිරීමේ වැඩසටහන් නැවත සංවිධානය කිරීම | කෙටි කාලීන | | | | | |
| 3 | **සනීපාරක්ෂක පහසුකම්** | | සෞඛ්‍ය සමාජය භාර ගුරුවරයා | නියෝජ්‍ය විදුහල්පති | 2018 මැයි | 2018 ඔක්තෝබර් | කලාප අධ්‍යාපන කාර්යාලයේ නියෝජිතයන් |
| | I. පාසල් මට්ටමේ දී සෞඛ්‍ය සමාජ බල ගැන්වීම | කෙටි කාලීන | | | | | |
| | II. විල්ලු ටැංකියෙන් කඩුක්කමුනෙයි වානි විද්‍යාලයට බාහිර කටයුතු සඳහා ජලය ලබා ගැනීමට පහසුකම් සැපයීම | දීර්ඝ කාලීන | විදුහල්පති | මන්මුනෙයි නිරිත ප්‍රාදේශීය සභාව | 2018 ජූනි | 2019 ජූලි | විදුහල්පති |
| | III. කොක්කඩිචෝලෙයි අයි.කේ. මහා විද්‍යාලයේ වැසිකිළි අලුත්වැඩියා කිරීම සහ අලුතෙන් වැසිකිළි ඉදි කිරීම | දීර්ඝ කාලීන | | පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව | 2018 ජූනි | 2019 ජූනි | |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| | IV. කෝවිලට එන බැතිමතුන් පාසල් වැසිකිළි පාවිච්චි කිරීම පිළිබඳව කොක්කඩිචෝලෙයි ප්‍රජා පාදක සංවිධාන සමග සාකච්ඡා කිරීම හා ඔවුන් දැනුවත් කිරීම | කෙටි කාලීන | විදුහල්පති | ග්‍රාම සංවර්ධන සමිතිය | 2018 ජූනි | 2018 ජූනි | විදුහල්පති |
| 4 | **පුස්තකාල භාවිතය** | කෙටි කාලීන | | | | | |
| | සිසුන් අතර සතියකට වරක් විනාඩි 15ක් පමණ උදෑසන රැස්වීමේ දී කියවීමේ පුරුදු ආරම්භ කිරීම සහ පුස්තකාලය භාවිත කිරීම සඳහා ඔවුන් පෙලඹවීම | කෙටි කාලීන | විදුහල්පති | නියෝජ්‍ය විදුහල්පති | 2018 ජූනි | 2018 ඔක්තෝබර් | කලාප අධ්‍යාපන කාර්යාලයේ නියෝජිතයන් |
| 5 | **විද්‍යාගාර භාවිතය** | කෙටි කාලීන | | | | | |
| | I. විද්‍යාගාර ක්‍රියාකාරකම් සහ සුදුසු උපකරණ සහ උපකරණ සූදානම් කිරීම පිළිබඳ පුහුණුව | කෙටි කාලීන | නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ විද්‍යාව | සේවාස්ථ උපදේශක (විද්‍යාව) වර්ල්ඩ් විෂන් ශ්‍රී ලංකා | 2018 මැයි | 2018 මැයි | නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ අධ්‍යාපන සංවර්ධන |
| | II. විද්‍යා ප්‍රායෝගික විෂයන් පිළිබඳව සිසුන්ට වැඩමුළුවක් | කෙටි කාලීන<br>කෙටි කාලීන | නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ විද්‍යාව | සේවාස්ථ උපදේශක (විද්‍යාව) | 2018 අගෝස්තු | 2018 අගෝස්තු | නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ අධ්‍යාපන සංවර්ධන |
| | III. විද්‍යා ප්‍රායෝගික විෂයන් සඳහා උපකරණ ලබා දීම | කෙටි කාලීන<br>කෙටි කාලීන | නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ විද්‍යාව | වර්ල්ඩ් විෂන් ශ්‍රී ලංකා | 2018 ජූනි | 2018 ජූනි | නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ අධ්‍යාපන සංවර්ධන |
| 6 | **පරිගණක කාමරය** | | | | | | |
| | I. පාසල්වලට පරිගණක සම්පාදනය කිරීම | දීර්ඝ කාලීන | නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ සැලසුම්කරණ | පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව | 2018 ජූලි | 2019 ජූලි | කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ |
| | II. පරිගණක වැඩිපුර ඇති පාසල්වලින් අතිරේක පරිගණක ලබා ගෙන ඒවා පරිගණක වඩාත් අවශ්‍ය කරන පාසල්වලට ලබා දීම | කෙටි කාලීන | නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ සැලසුම්කරණ | විදුලි සංදේශ හා තාක්ෂණික විෂය සම්බන්ධීකාරක | 2018 සැප්තැම්බර් | 2019 සැප්තැම්බර් | කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 7 | **ක්‍රීඩාංගණය සම්බන්ධ**<br>I. පාසල සතුව ක්‍රීඩාංගණ පහසුකම් නොමැති තැන්වල දී සිසුන්ගේ භාවිතය සඳහා ක්‍රීඩාංගණයක්/ස්ථානයක් හඳුනා ගැනීම | කෙටි කාලීන | සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ කායික අධ්‍යාපන | සේවාස්ථ උපදේශක (කායික අධ්‍යාපනය) සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | 2018 සැප්තැම්බර් | 2018 සැප්තැම්බර් | නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ අධ්‍යාපන කළමනාකරණ |
| | II. පාසල සතුව ක්‍රීඩාංගණ පහසුකම ඇති තැන්වල දී යටිතල පහසුකම් වැඩි දියුණු කිරීම සහ පාසල සතුව ක්‍රීඩාංගණ පහසුකම නොමැති තැන්වල දී ක්‍රීඩාංගණයක් නිර්මාණය කළ හැකි ක්‍රම සොයා බැලීම | දීර්ඝ කාලීන | නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ සැලසුම්කරණ | පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, දිස්ත්‍රික්ක ලේකම් කාර්යාලය | 2018 අගෝස්තු | 2020 අගෝස්තු | කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ |
| 8 | **ඉගෙනුම් ප්‍රවේශ** | | | | | | |
| | ධනාත්මක ඉගැන්වීම සඳහා ගුරුවරුන්ට පහසුකම් සැපයීම සහ සිසුන්ගේ සැඟවුණු නිපුණතාවන් හා දක්ෂතාවන් අනාවරණය වන ක්‍රියාකාරකම් ශක්තිමත් කිරීම | කෙටි කාලීන | විදුහල්පති | කලාප අධ්‍යාපන කාර්යාලයේ නියෝජිතයන් | මැයි 18 | 2018 දෙසැම්බර් | කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ |

**විද්‍යුත් පුරවැසි වාර්තාපතේ සොයා ගැනීම් පදනම් කර ගෙන පාසල් තුළ අධ්‍යාපනය පිළිබඳ තෘප්තිය වැඩි දියුණු කිරීම සඳහා ක්‍රියාකාරී සැලැස්ම - කල්කුඩා කලාප අධ්‍යාපන කාර්යාලය**

| අනුක්‍රමික අංකය | සේවාවන්හි ප්‍රමුඛතාව (කුමන සේවාවන් ද) | දීර්ඝ කාලීන හෝ කෙටි කාලීන උපක්‍රියාකාරකම් | වගකිව යුත්තේ කවුරුන් ද | වෙනත් පාර්ශ්වකරුවන්/ අවශ්‍ය සම්පත් | ආරම්භ කරන දිනය | අවසන් කරන දිනය | පසු විපරමේ යෙදෙන්නේ කවුරුන් ද |
|---|---|---|---|---|---|---|---|
| 1 | පානීය ජල පහසුකම් | 1) නිවසින් පිරිසිදු පානීය ජලය රැගෙන ඒමට සිසුන් දිරි ගැන්වීම<br>2) නළ මාර්ග සවි කිරීම සඳහා පියවර ගැනීම | දෙමව්පියන් සහ පන්ති භාර ගුරුවරයා,<br><br>මහජන සෞඛ්‍යය නිලධාරීන් | ප්‍රාදේශීය සභාව | 2018 ජූනි 01 | 2018 අගෝස්තු 31 | පාසල් කළමනාකරණ කණ්ඩායම |
| 2 | සනීපාරක්ෂක පහසුකම් | 1) පවත්නා වැසිකිළි භාවිත කරන ලෙස හැකි තාක් දැනුවත් කිරීම<br>2) වැසිකිළි සඳහා භාවිත කිරීමට ගැලුම්වලින් ජලය රැගෙන ඒමට සිසුන් දිරි ගැන්වීම<br>3) වැසි ජලය රැස් කර ගැනීම සඳහා ගත හැකි පියවරයන් සොයා බැලීම<br>4) ප්‍රජා පාදක සංවිධානවලින් සහාය ලබා ගැනීම | විෂය භාර ගුරුවරයා සහ සෞඛ්‍ය සමාජය | මහජන සෞඛ්‍යය නිලධාරීන්,<br><br>ශාරීරික අධ්‍යාපන ගුරුවරයා | 2018 ජූනි 02 | | පාසල් කළමනාකරණ කණ්ඩායම |
| 3 | පුස්තකාලය | 1) පුස්තකාල භාවිතය පිළිබඳව දැනුවත් කිරීම<br>2) පුස්තකාල පාඩමක් ප්‍රයෝගිකව ක්‍රියාත්මක කරන බව සහතික කිරීම<br>3) පන්ති කාමරය තුළ ජංගම පුස්තකාලයක් ක්‍රියාත්මක කිරීම<br>4) පොත් එක්රැස් කර ගෙන තාවකාලික පුස්තකාලයක් හෝ පිහිටුවීම<br>5) ස්ථිර පුස්තකාල පිහිටුවීම සඳහා පියවර ගැනීම | විදුහල්පති, පුස්තකාලය භාර ගුරුවරයා | විෂය භාර උපදේශකල පුස්තකාල සේවා | 2018 ජූනි 01 | | පාසල් කළමනාකරණ කණ්ඩායම |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 4 | විද්‍යාගාරය | 1) විද්‍යාගාර භාවිතය පිළිබඳව දැනුවත් කිරීම<br>2) පවත්නා පුස්තකාලය භාවිත කරන බව සහතික කිරීම<br>3) ස්ථිර පුස්තකාල පිහිටුවීමට පියවර ගැනීම | පාසල් කළමනාකරණ කණ්ඩායම | විෂය භාර උපදේශකල විද්‍යා ගුරුවරයා | 2018 ජූනි 01 | | පාසල් කළමනාකරණ කණ්ඩායම |
| 5 | දිවා ආහාරය | 1 සිට 5 දක්වා ශ්‍රේණිවල සිසුන් සඳහා ලබා දෙන දිවා ආහාරයේ ගුණාත්මක බව සහතික කිරීම | විදුහල්පති | මහජන සෞඛ්‍යය නිලධාරීන්,<br><br>ශාරීරික අධ්‍යාපන ගුරුවරයා | 2018 ජූනි 02 | | පාසල් කළමනාකරණ කණ්ඩායම |
| 6 | පෙළ පොත් | 1) පෙළ පොත් නැවත භාවිත කිරීම පිළිබඳව දැනුවත් කිරීම<br>2) පෙළ පොත් පරිස්සමින් භාවිත කර නැවත භාර දෙන්නේ කවුරුන් ද යන්න සම්බන්ධයෙන් තරගයක් පැවැත්වීම<br>3) නැවත භාවිත කිරීමට සුදුසු පෙළ පොත් ලබා ගැනීම සඳහා ළඟ ම තිබෙන පාසල් සමග සම්බන්ධතා ඇති කර ගැනීම | භාර ගුරුවරයා | කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ | 2018 ජූනි 03 | | පාසල් කළමනාකරණ කණ්ඩායම |
| 7 | පරිගණක කාමරය | 1 සිට 5 දක්වා ශ්‍රේණිවල සිසුන්ගේ පරිගණක භාවිතයේ ගුණාත්මක බව සහතික කිරීම | භාර ගුරුවරයා | විදුහල්පති | 2018 ජූනි 04 | | පාසල් කළමනාකරණ කණ්ඩායම |
| 8 | ගුරුවරුන් | 1) ගම් මට්ටමේ සිටින උගත් තරුණයන්ගෙන් සහාය ලබා ගැනීම<br>2) රාජ්‍ය නොවන සංවිධාන වලින් සහාය ලබා ගැනීම<br>3) කණ්ඩායම් ගුණාත්මක බව සහතික කිරීම<br>4) ජංගම ගුරු කණ්ඩායම් ක්‍රියාත්මක කිරීම<br>5) පන්ති කාමරයේ දී පාඩම් ඉගැන්වෙන බව සහතික කිරීම<br>6) අදාළ විෂයන් සඳහා ගුරුවරුන් ලබා දීමට පියවර ගැනීම | සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් | කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ | 2018 ජූනි 01 | | පාසල් කළමනාකරණ කණ්ඩායම |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 9 | මුළුතැන් ගෙය | පාසල් නිරීක්ෂණ කණ්ඩායම් නිර්මාණය කිරීම | කලාප කාර්යාල | පාසල් සංවර්ධන සම්බන්ධීකාරක | 2018 ජූනි 02 | | පාසල් කළමනාකරණ කණ්ඩායම |
| 10 | සුරක්ෂා රක්ෂණය | 1) පන්තියේ දී සිසුන්ට උපදෙස් දීම<br>2) සිසුන් එකතු වන අවස්ථාවල දී සිසුන්ට උපදෙස් දීම<br>3) දෙමව්පියන් දැනුවත් කිරීම | විදුහල්පති, පන්ති භාර ගුරුවරයා | කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ | 2018 ජූනි 03 | | පාසල් කළමනාකරණ කණ්ඩායම |
| 11 | නිල ඇඳුම | 1) නිල ඇඳුම්වල ගුණාත්මක බව පිළිබඳව සිසුන් දැනුවත් කිරීම<br>2) දෙමව්පියන් දැනුවත් කිරීම | භාර ගුරුවරයා | කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ | 2018 ජූනි 04 | | පාසල් කළමනාකරණ කණ්ඩායම |
| 12 | ආපන ශාලාව | 1) ආපන ශාලාවේ ගුණාත්මක බව සහතික කිරීම<br>2) පෝෂ්‍යදායක ආහාර සපයන බව සහතික කිරීම<br>3) ආහාර හා මිල ලැයිස්තුව සිසුන්ට පෙනෙන සේ ප්‍රදර්ශනය කරන්න<br>4) අහිතකර ආහාර අනුභවයෙන් වළකින ලෙස දැනුවත් කිරීම | පාසල් කළමනාකරණ කණ්ඩායම | පාසල් සංවර්ධන සම්බන්ධීකාරක | 2018 ජූනි 01 | | පාසල් කළමනාකරණ කණ්ඩායම |
| 13 | ක්‍රීඩාංගණය | හිතවතුන්ගේ, ප්‍රාදේශීය සභාවල සහාය | පාසල් කළමනාකරණ කණ්ඩායම | ප්‍රාදේශීය සභා මන්ත්‍රී | 2018 ජූනි 02 | | පාසල් කළමනාකරණ කණ්ඩායම |
| 14 | මායිම් තාප්පය | හිතවතුන්ගේ, ප්‍රාදේශීය සභාවල සහාය | පාසල් කළමනාකරණ කණ්ඩායම | ප්‍රාදේශීය සභා මන්ත්‍රී | 2018 ජූනි 03 | | පාසල් කළමනාකරණ කණ්ඩායම |

CEPA ආයතනය, යුරෝපා සංගමය විසින් අරමුදල් සම්පාදිත "සමාජ සංවර්ධනය හා යහපාලනය එකිනෙකට සමගාමීව ඇති කිරීම: වඩාත් හොඳ සමාජ සේවාවන් සම්පාදනය කිරීම සඳහා සිවිල් සමාජ සංවිධාන හා රජයේ ආයතන අතර සහයෝගිතාව වර්ධනය කිරීම" ව්‍යාපෘතිය යටතේ මඩකලපුව, මොණරාගල හා මුලතිවු දිස්ත්‍රික්කවල තෝරා ගත් ග්‍රාම නිලධාරී වසම් ගණනාවක විද්‍යුත් පුරවැසි වාර්තා පත් (eCRC) සමීක්ෂණ පැවැත්වීමේ කාර්යයට මුල පිරුවේ ය. විද්‍යුත් පුරවැසි වාර්තා පත් සමීක්ෂණවල අභිමතාර්ථය වූයේ අධ්‍යයන ප්‍රදේශය තුළ

(i) ද්විතීය අධ්‍යාපන සේවා සම්පාදනය
(ii) ප්‍රාදේශීය සභා රාජ්‍ය සේවා සම්පාදනය

යන ක්ෂේත්‍ර දෙකට අදාළව සේවාවන්හි ගුණාත්මක බව, සේවා සම්පාදකයන්ගේ වග වීම හා වැඩි දියුණු කළ යුතු අංශ තීරණය කිරීම යි. මෙම වාර්තාව සමාජීය වග වීම හා විනිවිද භාවය සාක්ෂාත් කර ගැනීමේ මෙවලමක් ලෙස විද්‍යුත් පුරවැසි වාර්තා පත යොදා ගැනීමේ අරමුණ ඇතිව පවත්වන ලද ප්‍රථම විද්‍යුත් පුරවැසි වාර්තා පත් සමීක්ෂණයේ සොයා ගැනීම් ඉදිරිපත් කරයි. දිස්ත්‍රික්ක තුන තුළ සේවා සම්පාදනය වැඩි දියුණු කිරීම සඳහා වහා ම අවධානය යොමු කළ යුතු හා පියවර ගත යුතු යැයි ප්‍රතිචාර දැක්වූවන් විසින් හඳුනා ගන්නා ලද අංශ ගණනාවක් විද්‍යුත් පුරවැසි වාර්තා පත් සමීක්ෂණයේ ප්‍රතිඵලවලින් අනාවරණය විය. විද්‍යුත් පුරවැසි වාර්තා සමීක්ෂණයේ ප්‍රාරම්භක සොයා ගැනීම් පදනම් කර ගෙන ක්‍රියාකාරී සැලසුම් සම්පාදනය කෙරුණු අතර සේවා සම්පාදකයන් හා සේවාලාභීන් අතර සාකච්ඡා සඳහා පහසුකම් සපයනු ලැබිණ. මෙම වාර්තාව සම්පාදනය කර ඇත්තේ මෙම අධ්‍යයනයේ සොයා ගැනීම් ප්‍රචලිත කිරීම පිණිස සහ අවශ්‍ය තැන්වල දී මෙහෙයුම් ප්‍රතිපත්ති වෙනුවෙන් අභිදේශනයේ යෙදීම හා ප්‍රතිසංස්කරණ පියවරයන් ගැනීම පිණිස මෙම තොරතුරු යොදා ගැනීම සඳහා ය.



29, ආර්. ජී. සේනානායක මාවත,
කොළඹ 07, ශ්‍රී ලංකාව.
දුර : +94 (011) 46902200, 2676955
විද්‍යුත් තැපෑල : info@cepa.lk
වෙබ් අඩවිය : www.cepa.lk

centre for poverty analysis

European Union
යුරෝපා සංගමය ஐரோப்பிய ஒன்றியம்

ACTED

ISBN: 978-955-3628-11-4